The magazine by

# පෙරමග

තුමෙහි කිච්චං ආතප්පං

පෙරමග
2001-2010 කණ්ඩායම

තෙවන වෙළුම - නොවැම්බර් 2021 | පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය, ආදි ශිෂ්‍ය සංගමයේ, පෙරමග දශක කණ්ඩායම විසින් සම්පාදිතයි.

# EDUCATION IN NEW NORMAL

යහ ගුණ මාතා

Driving Digitally-Agile Innovations

මාර්ගගත අධ්‍යාපනය දරුවන්ට අභියෝගයක් ද?





ලිය සිතක කවි ගෙතූ...
හද ස්වරය
Chandani Kodithuwakku
M138
චාන්දනී කොඩිතුවක්කු
Chandani Kodithuwakku
NIMTHARU
CONSTRUCTIONS
THE PARTNER OF YOUR CONSTRUTION
Nimtharu Constructions (Pvt) Ltd.
011 216 0420 I 011 193 0242 I 077 103 4300
www.nimtharuconstructions.com
info@nimtharuconstructions.com

# MERCH PACK

FOR REAL PALIANS ONLY

## GENTS VIP PACK

• SHIRT (LONG SLEEVES) • TIE • TIE PIN •
• CUFFLINKS • WATCH • MUG • PEN DRIVE • INK PEN •
• CARD HOLDER • KEY TAG • LUNCH BAG •

## LADIES VIP PACK

• BATIK SAREE • BROOCH (SAREE PIN) •
LUNCH BAG • PEN DRIVE • WATCH • MUG •




A Project by
***Peramaga Decade Group***
(Administrative Year - 2021/2022)

More info :
0711 050 234
Dhananja

**PERAMAGA DECADE GROUP
EXECUTIVE COMMITTEE 2021/2022**

Pevinda Balagama - President
Đhananja Elvitigala - Secretary
Harsha Ranasingha - Treasurer
Chamidu Wijayawardhana - Vice President
Yasantha Indeewara - Dep. Vice President
Neluka Abeysinghe - Dep. Vice President
Thilini Thilakarathne - Vice Secretary
Ranushika Erangi - Dep. Vice Secretary
Shiwantha Koswattage - Dep. Vice Secretary
Thilina Abeysekara - Dep. Treasurer
Ashan Kalubowila - Organizer
Adeesha Tharindu - Dep. Organizer
Hiyal Biyagamage - Editor
Sanjeewa Kariyawasam - Biannual Coordinator
Sulakshana Viduranga - Former President

Committee Members

Amila Maithripala, Charitha Senevirathne, Sandun Gamage, Apsara Madhuwanthi, Susith Dushantha, Dineka Dissanayaka, Mahawaththage Roshan, Chamali Nisansala, Chamara Atthanayake, Dulmi Wijenayake, Nishan Salinda, Mekhala Fernando, Kushan Perera, Rajini Wijesekara, Kasun Madushanka, Durekha Weerasinghe, Janith Deshapriya, Kalani Madushika, Udara Kathriarachchi, Hansimali Wickramarathne

**MAGAZINE COMMITTEE**

Editor - Hiyal Biyagamage

Management (Overall)
Pevinda Balagama, Đhananja Elvitigala, Hiyal Biyagamage

Management (Advertisements)
Thilini Thilakarathne, Mekhala Fernando, Đhananja Elvitigala

Management (Finance)
Harsha Ranasinghe, Thilina Bhagya

Designers
Thusitha Jayawardhana (Layout & Ads.)
Dasun Arangala (Layout & Ads.)
Đhananja Elvitigala (Layout & Ads.)
Nishadi Rukshani (Advertisements)
Priyadarshani Pathmila (Advertisements)
Tekla Ranasinghe (Advertisements)
Jayamuthu Sandamali (Advertisements)

Content Writers
Hiyal Biyagamage, Đhananja Elvitigala, Thilini Thilakarathne, Wathsala Rajaguru, Durekha Weerasinghe, Apsara Wijethilake, Chamali Nisansala, Sanjaya De Silva, Udara Kathriarachchi

Proof Readers
Mekhala Fernando, Thilini Thilakarathne, Hiyal Biyagamage, Đhananja Elvitigala, Charitha Seneviratne, Shiwantha Koswattage

Distribution
Chamidu Wijayawardhana,
Roshan Mahawaththage,
Adeesha Tharindu

# CONTENTS




5 කතු වැකිය

8 Education in New Normal

10 රම්‍ය විදුහලට වසන්තය කැන්දන් ආ අපේ කාලයේ නියමුවා

12 Spearheading Sri Lanka's Booming Building and Construction Industry




14 දම්පල් මිණිකැට

16 මාර්ගගත අධ්‍යාපනය (Online Education) දරුවන්ට අභියෝගයක් ද?

22 Driving a New Wave of 'Digitally-Agile' Innovations As a Response To COVID-19

24 පෙරමග කතාව

30 "යහ ගුණ මාතා" ලෙස අභිමන් ලැබූ දම්පල් අඹරේ පෑයූ ගුරු තරුව

36 අභිනව ධම්පල් කායවර්ධන මධ්‍යස්ථානය නොබෝ දිනකින්ම සිසු අයිතියට




38 COVID-19 සමයේ නූතන අධ්‍යාපනයේ දිශානතිය

42 පෙරමග අතීතයෙන් බිඳක්...

44 ජනප්‍රියත්වය පමණක් බලාපොරොත්තුවෙන් නිවේදකයෙකු වෙන්න එපා

කතු වැකිය

# දේශීය මාර්ගගත අධ්‍යාපන (online education) අභියෝගය ජයගැනීමට එක්වෙමු!



COVID-19 වසංගතය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට දැඩි පහරක් එල්ල කළා. වසරකට වැඩි කාලයක් පුරා, රජය විසින් පැනවූ සංචරණ සීමා නිසා සමස්ත ශිෂ්‍ය ප්‍රජාව ම නිවෙස්වලට කොටු වුණා. සුපුරුදු ඉගැන්වීමේ රටාව සම්පූර්ණයෙන්ම වෙනස්වීම හේතුවෙන්, දරුවන් මෙන් ම ගුරුවරුන් සහ දෙමව්පියන් ද මුහුණ පෑවේ විශාල අභියෝග රැසකටයි. වඩා හොඳ යටිතල පහසුකම් ඇති පාසල් කිහිපයකට මෙම අභියෝගය යම්තාක් දුරකට ජයගත හැකි වුව ද, පහසුකම් අඩු මට්ටමේ ඇති බහුතරයක් වූ පාසල්වලට මෙම අභියෝගය ඉතාමත් කර්කශ එකක් වුණා. ඒ හා සමානව, බොහෝ විශ්ව විද්‍යාල සිසුන් බ්‍රෝඩ්බෑන්ඩ්/තොරතුරු තාක්ෂණ සම්බන්ධතා ගැටළු සමඟ පොරබදමින් සිටින අතර, මාර්ගගත (online) අධ්‍යාපන ක්‍රමවේද අනුගමනය කිරීමේ දී සාමාන්‍ය ව්‍යුහාත්මක ඉගෙනුම් ප්‍රවාහයට බාධා ඇති වී තිබෙනවා.

විශේෂයෙන් ම, ප්‍රාථමික හා ද්විතීයික ඉගෙනුම් ක්‍රියාවලිය තුළ දෙමාපියන්ට විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට සිදුවී තිබෙනවා. නිදසුනක් වශයෙන්, දරුවන් තිදෙනෙකු සිටින (සියල්ලන්ම අවුරුදු 16 ට අඩු) දෙමව්පියන්ට මාර්ගගත පන්ති සඳහා අවශ්‍ය උපාංග තුනක් තිබිය යුතු අතර, දරුවන් තිදෙනා ම එකවර නිරීක්ෂණය කිරීම හෝ ඔවුන්ට උපකාර කිරීම ඉතා භාරදූර කාර්යයක්. දෙමව්පියන් දෙදෙනා ම පූර්ණ කාලීන රැකියාවක නිරත වෙනවා නම්, එය තවත් දුෂ්කර වෙනවා.

මාර්ගගත ඉගෙනීම සඳහා සිසුන්ගේ සහ දෙමාපියන්ගේ පමණක් නොව ගුරුවරුන්ගේ ද ආකල්පමය වෙනසක් අවශ්‍යයි. සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදයට වඩා, මාර්ගගත ඉගෙනීම හෝ මිශ්‍ර ඉගෙනීමට (blended learning) බෙහෙවින් ම වෙනස්. එම නිසා ගුරුවරුන් සහ අනෙකුත් අධ්‍යාපන පහසුකම් සපයන්නන්, සිසුන්ට දැනුම බෙදාහැරීමේ ක්‍රමවේදය තුළ නව මානයන් සොයා යා යුතු ය. සතුටට කරුණ නම්, ලංකාවේ බොහෝ ගුරුවරුන් මෙම වෙනස පිළිගෙන ඇති අතර, තාක්ෂණය ඉගෙන ගැනීමට, එයට අනුගත වීමට සහ තම ශිෂ්‍යයින් වඩාත් කාර්යක්ෂම ලෙස සම්බන්ධ කර ගැනීමට ඔවුන් කැමැත්තෙන් සිටියි.

මාර්ගගත අධ්‍යාපනයේ අන්තර්ගතය නැවුම් (novel) සහ SMART විය යුතුයි. SMART යනු Specific (විශේෂිත), Measurable (මැනිය හැකි), Actionable (ක්‍රියාත්මක කළ හැකි), Realistic (යථාර්ථවාදී) සහ Timely (කාලානුරූපී) වේ. අනවශ්‍ය අන්තර්ගතයන්ගෙන් යටපත් නොවී ප්‍රධාන සංකල්ප ග්‍රහණය කර ගැනීමට සිසුන්ට හැකියාව තිබිය යුතු ය. මීට අමතරව, ලැප්ටොප්, ඩෙස්ක්ටොප්, ටැබ්ලට් සහ ස්මාර්ට් ජංගම දුරකථන වැනි විවිධ උපාංගවලට ගැළපෙන පරිදි විෂය කාරණා සැකසීම කෙරෙහි ගුරුවරුන් වැඩි අවධානයක් යොමු කළ යුතු අතර භාවිත කරන උපාංග වර්ගය කුමක් වුවත් එයින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පාඩුවක් සිදු නොවීමට වග බලාගත යුතු ය.

මාර්ගගත ඉගෙනීමේ දී සිසුන්ගේ සහභාගීත්වය ඉතා වැදගත් වේ. ඇගයීම් හෝ විභාග තුළින් මෙය සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරනවා වෙනුවට, ගුරුවරුන් සහ අධ්‍යයන ආයතන වඩාත් අවධානය යොමු කළ යුත්තේ වඩාත් ආකර්ෂණීය විෂය සහ සමාජීය අන්තර්ගතයන් සැකසීම, විනෝදජනක වාතාවරණයක් ඇති කිරීම සහ සහභාගී වීම දිරිමත් කිරීම කෙරෙහිය.

ගුරු වෘත්තිය යනු ලෝකයේ ඇති ඉතාමත් උතුම් වෘත්තියක්. එබැවින්, මාර්ගගත අධ්‍යාපනය ඔස්සේ දරුවන්ට මනා අධ්‍යාපනයක් ලබාදීමට ගුරුවරුන් ආකල්පමය වෙනසක් ඇති කරගත යුතුයි. එමෙන් ම, ආර්ථික සහ යටිතල පහසුකම් නොමැති, මාර්ගගත අධ්‍යාපනය ලබා ගැනීමට ඇත්තෙන් ම අරගල කරන සිසුන්ට සහ පාසල්වලට පුරවැසියන් වශයෙන් අපගේ උපරිමයෙන් උපකාර කිරීම සිදු කළ යුතු ය. එය අනාගතය සඳහා කරන ප්‍රබල ආයෝජනයක්.

ඒ නිසා ශ්‍රී ලාංකිකයන් වශයෙන් දේශීය මාර්ගගත අධ්‍යාපන අභියෝගය ජයගැනීමට නොපැකිළිව එක්වෙමු!

*- හියල් බියගමගේ*

## Peramaga Decade Group - Executive Committee - 2021/2022

Past Pupils' Association of Dharmapala Vidyalaya Pannipitiya



**Front Row :** Hiyal Biyagamage (Editor), Thilina Abeysekara (Deputy Treasurer), Harsha Ranasingha (Treasurer), Neluka Abeysinghe (Deputy Vice President), Yasantha Indeewara (Deputy Vice President), Chamindu Wijayawardhana (Vice President), Pevinda Balagama (President), Dhananja Elvitigala (Secretary), Thilini Thilakarathne (Vice Secretary), Ranushika Erangi (Deputy Vice Secretary), Shiwantha Koswaththage (Deputy Vice Secretary), Ashan Kalubowila (Organizer), Sulakshana Viduranga (Former President)

**Mid Row :** Dulmi Wijenayake, Hansimali Wickramarathne, Rajini Wijesekara, Sanjeewa Kariyawasam (Biannual Coordinator), Sandun Gamage, Mahawaththage Roshan, Susith Dushantha, Kasun Madushanka, Mekhala Fernando, Charitha Senevirathne

**Back Row :** Durekha Weerasinghe, Dineka Dissanayaka, Kalani Madushika, Amila Maithripala, Adeesha Tharindu (Deupty Organizer), Udara Kathriarachchi, Kushan Perera, Chamali Nisansala, Apsara Madhuwanthi

**Absentees :** Chamara Atthanayake, Nishan Salinda, Janith Deshapriya



## හිටපු විදුහල්පතිතුමාගේ පණිවිඩය

Covid-19 වසංගතය ආරම්භ වීමත් සමඟ ම ගෝලීයව මෙන් ම දේශීයවද ක්ෂේත්‍ර ගණනාවක් සුවිශාල අභියෝග රැසකට මුහුණපාන්නට සිදු වුණා. අධ්‍යාපන ක්ෂේත්‍රය ඉන් එක් ප්‍රධාන පැතිකඩක්. රට පුරා පැන වූ සංචරණ සීමා හේතුවෙන්, පාසල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතන වැසීම නිසා දරුවන්ගේ සුපුරුදු අධ්‍යාපන රටාවන් බිඳවැටීමට ලක් වුණා. එසේම ඔවුන්ට සුපුරුදු ජීවන රටාවෙන් බැහැරව හුදකලාව කටයුතු කරන්නට සමහර විට සිදු වුණා. එය සමහර දරුවන් මානසික පීඩාවකට ලක්කරන කරුණක් වුණා.

මෙවැනි අභියෝග රැසක් මධ්‍යයේ වුවත්, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නගාලීමේ නව මානයන් සොයන්නට පාසැල්වලට සිදු වුණා. එහි එක් ප්‍රතිඵලයක් වූයේ මාර්ගගත අධ්‍යාපන (Online Education) ක්‍රමවේදයන් හඳුන්වා දීම. තරමක් නුපුරුදු වුවත්, මාර්ගගත අධ්‍යාපනය ඔස්සේ දරුවන් නැවතත් හරි මගට ගෙන එන්නට අවශ්‍ය සියලු කටයුතු නො පිරිහෙලා ඉටුකරන්නට රට පුරා ගුරු මව්පියවරුන් ඉතාමත් ප්‍රශංසනීය ලෙස කටයුතු කළා. එසේම දරුවන් මෙම අධ්‍යාපනික වැඩසටහන්වලට යොමු කරගැනීමේ අපේක්ෂාවෙන් ඔවුන් වෙනුවෙන් විවිධ අභිප්‍රේරණ වැඩසටහන් නිර්මාණය කර ඉදිරිපත් කළා. එම වැඩසටහන් බොහෝ දෙනෙකුගේ ඇගයීමටද ලක් වුණා.

නමුත් රටක් වශයෙන් ප්‍රායෝගික සහ කාලෝචිත මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදයක් ගොඩනන්නට තවමත් අපට හැකියාවක් ලැබී නෑ. දුෂ්කර ප්‍රදේශවල අඩු පහසුකම් සහිත පාසැල්වල දරුවන්ට, මාර්ගගත අධ්‍යාපනය තවමත් සිහිනයක් වී තිබෙනවා. මේ අභියෝගය රටක් වශයෙන් අප ජයගන්නේ කොයි ආකාරයෙන් ද?

අඛණ්ඩව තුන්වන වරටත් නිකුත් කෙරෙන 'පෙරමග' සඟරාවෙන් COVID සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරිවර්තනය මෙන් ම රටක් වශයෙන් මාර්ගගත අධ්‍යාපන අභියෝගය ජයගන්නේ කෙසේ ද යන වග මැනවින් පැහැදිලි කර තිබෙනවා. නොයෙකුත් බාධක මධ්‍යයේ වුව ද, 'පෙරමග' සඟරාව එළි දැක්වීමට පෙරමග දශක කණ්ඩායම ගත් වෑයමට සුභාශිංසන එක් කරමින්, මෙය ඉදිරියටත් සිදුකරන්නට අවශ්‍ය ශක්තිය සහ ධෛර්යය පෙරමග දශක කණ්ඩායමට ලැබේවායි ඉත සිතින් ප්‍රර්ථනා කරනවා..

**කර්නල් කේ. ජී. විමලසේන**
හිටපු විදුහල්පති
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## වැඩ බලන විදුහල්පතිනියගේ පණිවිඩය

පෙරමග දශක කණ්ඩායම විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන පුවත් සඟරාව මෙම වර්ෂයේ දී ද තෙවන වරටත් අතිසාර්ථක අයුරින් එළි දැක්වීම සම්බන්ධයෙන් පළමුව මාගේ හෘදයාංගම සුභාශිංසන පෙරමග දශක කණ්ඩායමට පුද කරමි. එමෙන් ම මෙවන් අසීරු කාල වකවානුවක දී මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පරිවර්තනය කරන ලද මෙම කාලීන ව්‍යාපෘතිය පිළිබඳව පැසසුම් එක් කරමි.

දශක කණ්ඩායමක් ලෙස වසර ගණනාවක් පුරාවට පාසලේ සුභසිද්ධිය උදෙසා සෑම විටම මූලිකත්වය ගෙන ක්‍රියාකරනු ලබන කණ්ඩායමක් ලෙස කැපීපෙනෙන සේවයක් සිදුකරන කණ්ඩායමක් ලෙස පෙරමග දශක කණ්ඩායම දැක්විය හැක. විශේෂයෙන් රටේ පැවති සහ පවත්නා ව්‍යසනකාරී තත්ත්වය සමග වුව ද පාසල තුළ සිදු කළ සහ සිදුකරන නොයෙකුත් ව්‍යාපෘතීන්වල දී දක්වන ලද සුවිශේෂ සහයෝගය බෙහෙවින් අගය කළ යුතු ය.

තවදුරටත් පාසල තුළ අනාගතයේ දී සිදුකරන ව්‍යාපෘති සහ වැඩකටයුතු වල දී සියලු බාධක මැඩගනිමින් සුවිසල් මෙහෙයක් ඉටුකිරීම සඳහා පෙරමග දශක කණ්ඩායමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ඩී. එන්. පී. පුල්ලෙපෙරුම**
වැඩබලන විදුහල්පති
(ශ්‍රී.ලං.අ.ප.සේ)
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපතිතුමාගේ පණිවිඩය

සමස්ත ලෝකයම අඛණ්ඩව වර්ෂ කිහිපයක් කෝවිඩ් - 19 වසංගතයට ගොදුරු වූ අවස්ථාවක දී ගත වූ වසර තුළ පාසල හා ආදි ශිෂ්‍ය සංගමය වෙනුවෙන් අමිල මෙහෙයක් ඉටු කිරීම පිළිබඳව පෙරමග දශක කණ්ඩායමට මාගේ ප්‍රසංශාවත්, ස්තූතියත් පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

පසුගිය කාල සීමාව තුළ විදුහල්පතිතුමාගේ හා මව් සංගමයේ මගපෙන්වීම යටතේ පාසල තුළ වූ නොයෙකුත් අවශ්‍යතා වෙනුවෙන් ඔබ කණ්ඩායම දැක්වූ දායකත්වය අගය කරන අතර ගත වූ වසරේ දී පාසල වෙනුවෙන් ලබාදුන් මූලික දායකත්වයන් අතර විද්‍යාලයේ අඩු ආදායම් සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක කළ ශිෂ්‍යත්ව ප්‍රදානයන්, පාසල් ක්‍රීඩාපිටිය නඩත්තුව සඳහා දැක්වූ දායකත්වයන්, හරිත ව්‍යාපෘතිය පිළිබඳව විශේෂයෙන් සිහිපත් කළ යුතු ය. එසේම මූල්‍ය උත්පාදනය සිදුකිරීම උදෙසා අපහසුතාවයන් පවතින කාලවකවානුක Merch Pack ව්‍යාපෘතිය වැනි නව සංකල්ප ඉදිරිපත් කරමින් මූල්‍ය උත්පාදනය සිදු කිරීම ඉතාම අගය කරමි. තවද ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය වර්ධනය සඳහා "පෙරමග පොකුර" නමින් ඔබ කණ්ඩායම විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිය මාගේ සිත් ගත් ව්‍යාපෘතියකි.

එම කාර්යයන් සාර්ථකව ඉටුකිරීම සඳහා පෙරමග දශක කණ්ඩායමට 2021 වසරේ නායකත්වයෙන් පෙරමග ගත් සභාපති, ලේකම් ඇතුළු සියලු විධායක කමිටු සභිකයින්ටත්, සියලුම සාමාජික සොයුරු සොයුරියන්ටත් ආදි ශිෂ්‍ය සංගමයේ ගෞරවය පුද කරමි.

පෙරමග දශක කණ්ඩායම විසින් වාර්ෂිකව නිකුත් කරන "පෙරමග සමරු පුවත් සඟරාව" වෙනුවෙන් වත්මන් විධායක සභාපති ලෙසත් පෙරමග කණ්ඩායමේ ආරම්භක සාමාජිකයෙකු ලෙසත් සුභාසිංශන එක් කරන්නේ ඉමහත් ආඩම්බරයෙනි.

එසේම ඉදිරි කාලසීමාව තුළ දී ඔබ කණ්ඩායම විසින් සිදුකිරීමට නියමිත සංගීත ප්‍රසංගය සහ සය සාමාජික සැහැල්ලු ක්‍රිකට් තරගාවලිය ඉතා සාර්ථකව සිදුකිරීමට හැකිවේවායි ද ප්‍රාර්ථනා කරමි.

**දේශමාන්‍ය ජීවන් යාපා**
විධායක සභාපති (2020/2021)
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම්තුමාගේ පණිවිඩය

"පෙරමගට සුභ පතමි!"

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ "පෙරමග දශක කණ්ඩායම" සුවිශේෂී කණ්ඩායමකි. මන්දයත්, මේ මොහොතේ දී සමස්ත ආදි ශිෂ්‍ය සංගමයේ ම ජවය රඳාපැවතීමත්, සමස්තයක් ලෙස වැඩිම පිරිසක් සාමාජිකත්වය ගෙන අත්වැල් බැඳගෙන සිටින සංවිධානයක් නිසාය. පාසල වෙනුවෙන් සහ ආදි ශිෂ්‍ය මවු සංගමය වෙනුවෙන් ක්‍රියාත්මක කරන කවර ව්‍යාපෘතියක දී වුව ද සාධනීය ලෙස පෙරට එන පෙරමග දශක කණ්ඩායම වාර්ෂිකව නිකුත් කරන සඟරාව වෙනුවෙන් සුභාශිංසන පණිවුඩයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටිනි.

විශේෂයෙන් පෙරමග කණ්ඩායමේ ආරම්භක සාමාජිකයින් දෙදෙනෙකු මවු සංගමයේ විධායක සභාපති සහ භාණ්ඩාගාරික යන ප්‍රධාන තනතුරු ද්විත්වය දරන වකවානුවක මෙම සඟරාව නිකුත් වීම ද එයට වඩාත් වටිනාකමක් හිමිවනු ඇත.

මුළු ලොවම වෙළාගත් කෝවිඩ් වසංගත කාල වකවානුවක දී ආදි ශිෂ්‍ය මවු සංගමය සහ විද්‍යාලය ක්‍රියාත්මක කළ සෑම ව්‍යාපෘතියකට ම දක්වන ලද සක්‍රීය දායකත්වය පිළිබඳ ස්තුතිය පුද කරමි. එමෙන් ම, පෙරමග කණ්ඩායමක් ලෙස එකතුව ඉටුකරන ලද සේවාවන් සහ දායකත්වයන් ද රැසකි. මේ සියලු කටයුතු වෙනුවෙන් වර්තමානයේ දී නායකත්වය ලබාදෙන පෙවින්ද බැලගම (සභාපති) සහ ධනංජ ඇල්විටිගල (ලේකම්) සොයුරන් ඇතුළු පෙරමග දශක කණ්ඩායමේ විධායක සභාවේ සැමටත්, සමස්ත පෙරමග සාමාජිකත්වයටත්, මවු සංගමයේ ප්‍රශංසාව සහ ස්තූතිය පුදකරමි.

පෙරමග කණ්ඩායමේ සොයුරු සොයුරියන් වර්තමානයේ දී විවිධ ක්‍රියාකාරකම් ඉටු කරමින්, ලබන අත්දැකීම් පාසලේ හා මවු සංගමයේ චිර දියුණුව වෙනුවෙන් යොදවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. පෙරමග තුළින් "අනාගත නායකයන්" රැසක් බිහිවේවායි පතමි.

**දුමින්ද සංජීව බාලසූරිය**
ප්‍රධාන ලේකම් (2020/2021)
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## පෙරමග දශක කණ්ඩායමේ සභාපතිතුමාගේ පණිවිඩය

පෙරඹර නැගෙන උදාහිරුගේ කිරණින් දසත ආලෝකවත් වන්නාසේ දම්පල් විදුමෑණියන්ගේ ප්‍රභාව ඔපනංවමින් පෙරමග ප්‍රභාවත් කරනු ලබන්නේ අපේ පෙරමගයි. නැණ ගුණ සපිරි මතු පරපුරක් බිහිකිරීමට එදා මෙදාතුර අමිල වූ මෙහෙවරක් ඉටුකරනු ලබන දම්පල් විදුමෑණියන්ගේ පෙරමග වඩා යහපත් කිරීමේ අභිප්‍රායෙන් පෙරමග දශක කණ්ඩායමේ අපි නිරන්තරයෙන් ඇපකැප වන්නෙමු.

විදුපියසේ භෞතික සම්පත්, සංවර්ධනය, අධ්‍යාපනය, ක්‍රීඩාව හා සෞන්දර්යාත්මක අංශ ඉහළ නංවමින් සිසුකැලගේ සහ පාසලේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කරනට පෙරමග බලඇණියේ වර්තමාන සභාපති ධුරයට පත්වීම මා ලද මහත් වූ භාග්‍යයකි. එසේම වර්තමානයේ ගෝලීය අර්බුදයක් බවට පත්ව ඇති මාරාන්තික කොරෝනා වසංගතය අභිමුඛයේ ද නොසැලී මහා පවුරක් සේ පෙරමග ව්‍යාපෘතියේ වැඩකටයුතු සාර්ථකව සිදුකිරීමට පෙරමග අපට හැකිවීම සාඩම්බරයකි. එමෙන් ම පෙරමග මහා පවුර විසින් දියත් කරනු ලබන සියලු ම ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් පෙරමග සමස්ත සාමාජික සාමාජිකාවන් දැනුවත් කිරීම හා සාමාජික ශක්තිය වර්ධනය කිරීමේ අදිටනින් මෙවරත් පෙරමග වාර්ෂික සඟරාව ප්‍රකාශනයට පත්කරනු ලැබී ය. පෙරමග පෙරගමනයට මහාපවුරක් සේ අත්වැල් බැඳ කටයුතු කළ සියලු ම දෙනාට හදපිරි තුති පුදකර සිටින අතර ඉදිරියටත් අප සමග අත්වැල් බැඳන් කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. එසේම මෙම සඟරාව සාර්ථකව ඉදිරිපත් කිරීමට උරදුන් වත්මන් ලේකම්තුමා හා සංස්කාරකතුමා ඇතුලු සඟරා කමිටුවට ද මාගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටින අතර ඉදිරියටත් පෙරමග සඟරාව සාර්ථකව ප්‍රකාශනයට පත්කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි...

**පෙවින්ද බැලගම**
සභාපති (2021/2022)
පෙරමග දශක කණ්ඩායම,
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



## පෙරමග දශක කණ්ඩායමේ ලේකම්තුමාගේ පණිවිඩය

සාර්ථක ව්‍යාපෘති සහ වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරමින් 2021/2022 පරිපාලන වර්ෂයේ අවසාන භාගය ගතකරමින් සිටින අවධියක, මූල්‍ය උත්පාදන ව්‍යාපෘති අතරින් 'පෙරමග සඟරාව' මෙම වසරේ ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස ඉතිහාසගත වීම පිළිබඳව පෞද්ගලිකව බෙහෙවින් සතුටු වෙමි. මන්දයත්, පෙරමග දශක කණ්ඩායම විසින් පසුගිය වර්ෂයන්හිදී ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතීන් හැටියට සිදු කළ 'ගෘහස්ථ සංගීත ප්‍රසංග' මෙම පරිපාලන වර්ෂයේ දී සිදු කිරීමට නොහැකි වුව ද 'පෙරමග සඟරාව ව්‍යාපෘතිය' ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය හැටියට කාලෝචිතව යොදාගැනීමට හැකි වූ නිසා ය.

'වසංගත තත්ත්වය' යන ඍණාත්මක වචනය නිසා ම මෙම පරිපාලන වර්ෂයේ සමහර ව්‍යාපෘතීන් සඳහා ගත වූ කාලය දීර්ඝ වුව ද අවසාන ප්‍රතිඵලය ධනාත්මක වීම සැබවින් ම සතුට ගෙනෙන කරුණකි. මෙම සඟරාවේ අන්තර්ගත කර ඇති 'පෙරමග කතාව' නම් ලිපියේ අප විසින් සිදු කරන ලද ව්‍යාපෘති මෙන් ම වැඩසටහන් පිළිබඳව ද විස්තර කර ඇති අතර මේ වනවිට එම ව්‍යාපෘති බොහෝමයක් අවසන් කඩඉමේ පසුවන අතර පෞද්ගලික කටයුතු පසෙක ලා මෙම ව්‍යාපෘති සඳහා වෙහෙසෙන පෙරමග සහෝදර සහෝදරියන් හට හිස නමා ආචාර කරමි.

මෙම පරිපාලන වර්ෂයට අදාළ දෙවන ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය වන Merch Pack ව්‍යාපෘතිය හුදෙක් මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් ම නොවන අතර එම ව්‍යාපෘතිය මගින් ආදි සිසු සිසුවියන්ගේ ධර්මපාල විද්‍යාලයීය අනන්‍යතාව විදහාපෑමේ නව පිම්මක් ලෙස පෙන්වා දිය හැකි ය.

මෙම ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘති ද්විත්වය සඳහා ම ඇපකැප වූ සියලු දෙනා පිළිබඳ විස්තරයක් මෙම සඟරාව අවසාන පිටුවක සඳහන් කොට ඇත. පෙරමග වෙනුවෙන් වෙහෙසෙන සියලු දෙනාට ඉදිරියටත් එවන් දායකත්වයන් ලබාදීමට උනන්දුව සහ ශක්තිය ලැබේවායි හද පත්ලෙන් ම ප්‍රාර්ථනා කරමි...

පෙරමගට සදා ජය!!!

**ධනංජ ඇල්විටිගල**
ලේකම් (2021/2022)
පෙරමග දශක කණ්ඩායම,
ආදි ශිෂ්‍ය සංගමය,
ධර්මපාල විද්‍යාලය පන්නිපිටිය.



SHUTTERSTOCK©

# EDUCATION IN NEW NORMAL

## Building a resilient system in sri lanka beyond pandemic

Despite commendable efforts by many countries to put in place alternative remote learning strategies and corrective measures, learning losses have been unavoidable and substantial. Last year saw close to 1.6 billion students from over 180 countries being kept out of schools for extended periods in response to the COVID-19 pandemic. The UNESCO Institute for Statistics estimates that by early November 2020, the world student population had lost between 41% and 68% of in-person schooling they would have received under usual circumstances.

In this second year of the pandemic, many countries are moving from emergency responses towards policies aimed at recovery. Along with reopening schools and resuming education, these include tailored support to help students adjust to learning in the new normal and remedial measures to make up for lost learning.

Sri Lankan schools have been largely dysfunctional for over 15 months since initial closures in March 2020, despite some brief periods of operation. This blog examines policy responses adopted in Sri Lanka's education sector over the past year, with a view of informing its future education recovery strategy in 2021 and beyond.

### School closures in perspective

As of March 2021, Sri Lankan schools are estimated to have been fully closed for 28 weeks and partially closed for 15 weeks. As shown in the infographic (Figure 1), these numbers– especially of full closures – and as a result, the share of total school days missed are significantly higher compared to all country income group averages. These figures are likely to increase further, given the current indefinite closures following the third wave of the pandemic.

### Immediate response: Distance education

The government's response to current school closures encourages schools to continue and expand online programmes, which have been in operation since last year. However, online learning platforms in Sri Lanka suffer from access and quality issues, also confirmed by estimates of a recent survey conducted among public school teachers and parents across the country. As Figure 3 in the infographic shows, less than 50% of students were reached online on average; further, it ranged from a low of 8% in the smallest schools – which are typically the least privileged – to 59% in the largest.

The survey also indicates that education via TV proved to be a better way of reaching students in smaller schools. However, several pedagogical and logistical challenges have hindered effectiveness. These include lack of links between televised programmes and teachers' lesson plans; a passive teaching style and absence of interaction with students; confusion of timing and duration of different subjects and TV channels; and poor communication of programme information to schools, students, and parents.

### Long-term response: Recovery strategies

The government's strategy for recovering learning losses in the longer term also remains unspecified. Interviews conducted with sector stakeholders revealed that some privileged schools had initiated remedial measures at the school level, leveraging available resources and support from community networks.

These include: (1) assessing student learning via Google Form assessments and telephone follow-ups; (2) monitoring student progress on attendance, work submitted, and marks obtained for

# SCHOOL CLOSURES SRI LANKA & GLOBAL

FIGURE 1: DURATION OF SCHOOL CLOSURES IN SRI LANKA AND BY COUNTRY INCOME GROUP, MARCH 2020 - MARCH 2021







FIGURE 2: NUMBER OF CHILDREN AFFECTED BY SCHOOL CLOSURES GLOBALLY




Source: https://en.unesco.org/covid19/educationresponse and authors' calculations

FIGURE 3: SHARE (%) OF STUDENTS REACHED VIA INTERNET AND TV IN SRI LANKA, BY SCHOOL SIZE




Source: IPS

assessments; and (3) reducing curricula content to help students and teachers cope better. Apart from lower access to resources, centralised decision-making has made it difficult to implement similar school-level measures in less-privileged schools.

## Areas for urgent action

The above discussion suggests that emergency and recovery measures adopted in Sri Lanka during COVID-19 school closures have worsened education inequities. To alleviate the current education crisis and commit to leaving no one behind, urgent action is needed in the following areas:

### *Reopen schools in low-risk areas*

It is useful to consider opening schools in remote COVID-19 low-risk areas where distance learning is neither accessible nor effective, which usually have smaller student populations, allowing for better adherence to health guidelines such as physical distancing.

This can be done by allowing schools to make decisions in discussion with relevant school committees and regional education authorities, as opposed to blanket decisions made at the central level for all schools. Such plans should also involve strategies for more permanent ways of keeping schools open, supported by regular cost-effective testing of both teachers and students and vaccinating teachers as a priority group.

### *Continue hybrid learning when schools reopen*

The periodic interruptions to school reopening attempts underscore the need for a well-developed hybrid system for education delivery – consisting of a mix of in-person and remote options – so that teachers and students can shift smoothly to distance learning during an emergency. Even when schools are open, safety measures will not permit all students to attend school daily in highly-populated schools, necessitating blended learning to ensure uninterrupted learning. Recent research based on different country experiences shows that effective hybrid learning can be offered in any setting by identifying the best combination of education modalities, learning material, and methods of communication in line with available resources, skills, and technology.

### *Improve pedagogy for distance learning*

Distance education is here to stay in some form or the other, at least in the foreseeable future. Ensuring effective remote pedagogy is particularly challenging for TV broadcasts instead of online teaching, where programme design has to ensure continuity in the face of the central teacher. Given that TV is the most feasible way of reaching less-privileged students in Sri Lanka, it is crucial to address existing pedagogical and logistical issues.

Reviewing measures taken in countries such as Pakistan and Vietnam to overcome similar challenges can be useful in this regard. These include:

- Leveraging school teachers, subject experts, and timetabling specialists to develop TV lessons aligned to the national curricula
- Organising mass communication campaigns such as teaser videos and social media and newspaper advertising, leveraging public figures like politicians
- Maintaining communication between schools and parents by telephone, online teacher-parent meetings, and home visits for updates of learning progress.

*- Hiyal Biyagamage*



SHUTTERSTOCK©

# K.G. විමලසේන: රම්‍ය විදුහලට වසන්තය කැන්දන් ආ අපේ කාලයේ නියමුවා



වසර 80ක ප්‍රෞඩ ඉතිහාසයකට හිමිකම් කියන පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ස්වර්ණමය යුගය උදාකළ, හිටපු විදුහල්පති K.G. විමලසේන ගුරු පියාණන්, වසර 29ක තම සේවා කාලය නිමකොට පසුගිය ඔක්තෝබර් 10 වනදා විශ්‍රාම දිවියට එළඹිණි.

1992 වර්ෂයේ තම උපන්බිම වන රත්නපුර, කිරිඇල්ල ප්‍රදේශයේ එපිටවල මහා විද්‍යාලයේ උපාධිධාරී ගුරුවරයෙකු ලෙස සේවයට එක්වූ එතුමා, 1993 වර්ෂයේදී අධ්‍යාපන පරිපාලන සේවා විභාගයෙන් සමත් විය. එතුමා අප විද්‍යාලයත් සමඟ මුලින්ම සම්බන්ධ වන්නේ 1994 වර්ෂයේදී නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු වශයෙනි. නමුත් 1995 වසරේ දී, එවකට විදුහල්පති S.H. කුමාරසිංහ මහතා නික්ම යාමත් සමඟ, 1995 වර්ෂයේ පාසලේ වැඩ බලන විදුහල්පතිවරයා වශයෙන් සේවය කළේය. 1997 වසරේ දී පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් වැඩ භාරගන්නා එතුමා, අප විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් නැවත වරක් 2004 වර්ෂයේදී පත්විය.

2004 වර්ෂයේ අප විද්‍යාලයට ස්වර්ණමය යුගයක් උදා කරමින් විදුහලේ මුල් පුටුව හෙබවූ එතුමා, 2016 වනතෙක් වසර 12කට අධික කාලයක් පාසැල වෙනුවෙන් සිදුකලේ අද්විතීය සේවාවකි. වසර 12කට අධික සේවා කාලයක් තුළ, වැඩිම කලක් එම තනතුර දරූ විදුහල්පතිවරයා ලෙස එතුමා විදුහල් ඉතිහාසයට එක්වේ. මෙම කාල සීමාව තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපන, ක්‍රීඩා සහ සෞන්දර්යාත්මක කෞශල්‍යයන් ඉහළ තලයකට ගෙන එමින්, පාසැල තුළ අද්විතීය භෞතික සම්පත් සංවර්ධන ක්‍රියාදාමයකට නායකත්වය ලබාදීමට විමලසේන මැතිතුමාට හැකියාව ලැබිණි. ආදි ශිෂ්‍යයන්, දුවා දරුවන් සහ දෙමාපියන්ගේ දැඩි ඉල්ලීම මත නැවත වරක් එතුමා අප විද්‍යාලයට පැමිණෙන්නේ 2020 වර්ෂයේ පෙබරවාරි මාසයේදීය. එතැන් සිට, විශ්‍රාම යනතෙක්ම, COVID වසංගතය රැගෙන ආ නොයෙක් අභියෝග මධ්‍යයේ, පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු මාර්ගගත අධ්‍යාපන ක්‍රමය (Online Education) යටතේ අඛණ්ඩව පවත්වාගෙන යාමට එතුමාට හැකිවිය.

"පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය හා සම්බන්ධ වීමට ලැබීම මා ලද මහඟු භාග්‍යයකි. දෙමාපියන්, දූ දරුවන් සහ ආදි ශිෂ්‍යයන් සමඟ එක්වී, අපේ පාසල සෑම ක්ෂේත්‍රයකින්ම අංග සම්පූර්ණ වූ විශිෂ්ටතම මිශ්‍ර පාසලක් බවට පත් කරන්නට මට හැකියාව ලැබුණා. අධ්‍යාපන, ක්‍රීඩා සහ සෞන්දර්ය අංශවලින් පමණක් නොව, පාසැල තුළ විශාල භෞතික සම්පත් සංවර්ධන ක්‍රියාවලියක් සිදු කරමින්, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ලංකාවේ පාසල් අතර ඉහළම තැනකට රැගෙන ඒමට හැකිවීම මා ලද විශාල ජයග්‍රහණයක්," එතුමා අප සමඟ පැවසිය.

K.G. විමලසේන මැතිතුමා විදුහල්පතිව සිටි කාල සීමාව තුළ සිදුවූ අතිවිශිෂ්ට සේවයෙන් බිඳක් පහත දැක්වේ.

## භෞතික සම්පත් සංවර්ධනය

K.G. විමලසේන මැතිතුමාගේ මග පෙන්වීම යටතේ පාසැල තුළ 20කට අධික වූ ගොඩනැගිලි ප්‍රමාණයක් ඉදිවිය. මෙමගින් පාසලේ පැවති ගොඩනැගිලි ඌනතා රාශියක් සපුරාලීමට හැකිවිය. මෙයට පිහිනුම් තටාකය සහ ජීවිත ආරක්ෂක පුහුණු මධ්‍යස්ථානය, නවීන ආපනශාලාව සහිත තෙමහල් ගොඩනැගිල්ල, පුස්තකාලය, පරිගණක සම්පත් මධ්‍යස්ථානය සහ විද්‍යාගාර සහිත තෙමහල් ගොඩනැගිල්ල, අංගසම්පූර්ණ ගෘහස්ථ බැඩ්මින්ටන් සහ ජිම්නාස්ටික් ක්‍රීඩාගාර වැනි වටිනා භෞතික සම්පත් රාශියක් අයත්වේ. මීට අමතරව පාසලේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය නවීකරණය කිරීම, හයිලෙවල් පාරට යාබද මායිම් තාප්පය සහ ගේට්ටු ආකර්ශනීය ලෙස සැකසීම, විවිධ විෂයන් සහ අමතර ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පන්ති කාමර සහ ගොඩනැගිලි ඉදිකිරීම, දුවා දරුවන්ගේ සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිලි සහ කැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම, දරුවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම දියුණු කිරීමට පරිගණක විද්‍යාගාර ඉදිකිරීම වැනි කටයුතුවලට සුවිශේෂී නායකත්වයක් ලබාදුනි.

එතුමාගේ කාලයේදී පාසල් භූමිය තුළ ඉදිකර තිබූ Zeeda ගොඩනැගිල්ල දීර්ඝ කාලීන උත්සහයකින් පසුව නැවතත් පාසලට ලබාගෙන විද්‍යාලීය දූ දරුවන්ගේ සෞන්දර්ය කුසලතා ඔප්නැංවීම වෙනුවෙන් යොදවා ඊට අවශ්‍ය පහසුකම්ද සපයන ලදී. මීට අමතරව පසුගිය අගෝස්තු මාසයේදී ජාතික ශිෂ්‍ය භට කණ්ඩය විසින් පරිහරණය කරන ලද පාසලට අයත් පර්චස් 100ක් වන බිම් කොටස සහ එම ගොඩනැගිල්ල නැවතත් පාසැල වෙත ලබාගැනීමට නායකත්වය ලබාදෙන ලදී. එතුමාගේ කාලයේදී ආරම්භ කරන ලද ක්‍රීඩා පිටිය සංවර්ධන ව්‍යාපෘතිය මේ වනවිට අතිශය එලදායී ව්‍යාපෘතියක් වී ඇත. වියලි කාලවලදී ක්‍රීඩා පිටියට ජලය සැපයීම සඳහා ඉදිකරන වගා ළිඳට අවශ්‍ය පර්චස් 02ක බිම් කැබැල්ලක් පරිත්‍යාගයක් ලෙස විදුහල් භූමියට එක කරගැනීමටද මෙතුමාට හැකිවිය. එම භූමියේ ළිඳක් කපා ක්‍රීඩා පිටියේ තණ තීරුවට ජලය සැපයීමට ඉදිරියේදී හැකිවනු අතර, එම කටයුතු මේ වනවිට අවසන් අදියරේ පවතී.

මෙවැනි වටිනා සහ එලදායී සංවර්ධන ක්‍රියාවලින් නිසා 2010 වසරේ දී අප පාසලට DNO නෙදර්ලන්ත ආයතනය විසින් ISO 9001 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය පිරිනමන ලදී. මෙමගින් එතුමාගේ දක්ෂ පරිපාලන හැකියාවන් පිළිබඳව මනා ලෙස සනාථ විය.

## අධ්‍යාපනය

පාසලේ අ.පො.ස (සා.පෙළ) විභාග ප්‍රතිඵල 75% සිට 99% දක්වා වර්ධනය කිරීමටත්, අ.පො.ස (උ.පෙළ) සමත්ව විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබාගත් සිසුන් සංඛ්‍යාව 35 සිට 110 දක්වා වර්ධනය කිරීමට K.G. විමලසේන මැතිතුමාට හැකිවිය. පන්ති අධීක්ෂණය මගින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය නැංවීම සහ විවිධ දක්ෂතා ඇති සිසුන්ගේ හැකියාවන් පන්ති කාමරයේදීම හඳුනාගැනීමට ක්‍රමවේද සකස් කර, සිසුන්ගේ සටහන් පොත් එතුමා ඇතුළුව කළමනාකරණ මණ්ඩලය විසින් පරීක්ෂා කර අත්සන් තබා ඔවුන්ට අදාල මග පෙන්වීම සිදුකරන ලදී.

## ක්‍රීඩා

මෙතුමාගේ කාලයේදී ක්‍රීඩා ක්ෂේත්‍රයේ මල්ඵල හටගත් කාලයක් බව කටත් නොරහසකි.



දැල්පන්දු, මළල ක්‍රීඩා, ජිම්නාස්ටික් සහ චෙස් වැනි ක්‍රීඩා රාශියක් නියෝජනය කරමින් පාසලේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කලාප, පළාත්, සමස්ථ ලංකා, ජාතික සහ අන්තර්ජාතික ජයග්‍රහණ රැසක් පාසැල වෙත ගෙන ඒමට අවශ්‍ය නායකත්වය සහ පහසුකම් සපයන ලදී. පිහිනුම් තටාකය සහ ජීවිත ආරක්ෂක පුහුණු මධ්‍යස්ථානය, අංගසම්පූර්ණ ගෘහස්ථ බැඩ්මින්ටන් සහ ජිම්නාස්ටික් ක්‍රීඩාගාර, පැසිපන්දු පිටිය, නවීකරණය කරන ලද දැල්පන්දු සහ වොලිබෝල් පිටි ගොඩනැගුනේ මෙතුමාගේ කාලයේදීය. එමෙන් ම ක්‍රීඩා පිටිය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මුලිකත්වය ගනිමින්, මාතර රාහුල විද්‍යාලය සමඟ පවත්වන මහා ක්‍රිකට් තරඟය ආරම්භ කිරීමටත් නායකත්වය ලබාදුනි.

### සෞන්දර්ය

සිසුන්ගේ මෙන් ම ගුරු භවතුන්ගේ සෞන්දර්ය දක්ෂතා කුළු ගැන්වෙන සංකලන, සමනල සංකලන (ප්‍රාථමික අංශයේ දරුවන් සඳහා) සහ ගුරු සංකලන වැනි සුවිශේෂී ප්‍රසංගයන් බිහි කරමින්, වර්තමානය දක්වාම ඒවා සුවිශේෂී අංගයන් ලෙසින් පවත්වාගෙන ඒමට කටයුතු කරන ලද්දේ මෙතුමා විසිනි. සෞන්දර්ය සහ කලා ක්ෂේත්‍රයේදී විද්‍යාලීය නාට්‍ය, නර්තන, ගායන සහ වාදන කණ්ඩායම් ජාතික තලය දක්වා ගෙනයාමට කටයුතු කරමින්, විද්‍යාලීය දුවා දරුවන් ශ්‍රී ලාංකීය මාධ්‍ය, සංගීත, නර්තන සහ නාට්‍ය ක්ෂේත්‍රයන්හි දැවැන්තයින් කිරීමට අවශ්‍ය මග පෙන්වීම නො පිරිහෙලා ඉටුකරන ලදී. 2014 වසරේ දී පාසලේ දරුවන් දෙදෙනෙකු සහභාගී කරගනිමින්, පණ්ඩිත අමරදේව සහ ආචාර්ය රෝහණ වීරසිංහ වැනි දැවැන්තයින් සමගින් සම්බන්ධ වී කළ ගීත කැසට් පටිය එතුමා අදත් ඉතාමත් සෙනෙහසින් සිහිපත් කරයි.

අප විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් පෙරමග දශක කණ්ඩායම සමඟ එක්වී වසර ගණනක් පුරා පාසලේ ප්‍රධාන ව්‍යාපෘති රැසක් K.G. විමලසේන මැතිතුමාගේ නායකත්වය යටතේ ඉටුකිරීමට ලැබීම අපි සියලු දෙනාම ඉතා භාග්‍යයක් කොට සලකනවා. දම්පල් පින්බිම, සෑම අතින්ම රම්‍ය විදුහලක් කිරීමට මෙතුවක් කල් උරදුන් ගුරු පියාණෙනි, ඔබට චිරං ජයතු!

*- හියල් බියගමගේ*




# SPEARHEADING SRI LANKA'S BOOMING BUILDING AND CONSTRUCTION INDUSTRY

Veteran industry professional and esteemed past pupil of Pannipitiya Dharmapala Vidyalaya, Dr. Rohan Karunaratne says nurturing self-independence for progressive career growth is critical for next-gen engineers



Dr. Rohan Karunaratne, President of Ceylon Institute of Builders (CIOB)– the premier professional organisation of building and construction professionals in Sri Lanka– and Chairman of A.K.K. Engineers is an eminent academic and professional. Most importantly, Dr. Karunarartne is a proud past pupil of Pannipitiya Dharmapala Vidyalaya, where he entered the school in 1967. Since then, he has been a great part of the school's legacy as a bright student and a resourceful past pupil involved in many school development programmes.

We sat down with Dr. Karunaratne for a quick chat to reminisce some of his fond memories at school. Here are the excerpts:

**Can you share some of your fond memories at our school?**

I was a lovable student by the teachers at the school, which was mostly positive. However, as a result of being well-known, I faced some perplexing situations. I oddly remember a fight breaking out in my class, which Mr. Gunasekara, the principal at that time, witnessed. However, as I was the student he knew well, I received the punishment on behalf of my entire class. Some of my fondest experiences at Dharmapala college were as such.

**What made you chose engineering as your profession?**

My father was the Director of Health Education, so I was pushed towards medicine. However, I was very weak in Zoology yet did extremely well in mathematics. My parents understood my ability for Maths and proceeded to let me follow its path. After my school studies, I continued with my engineering career and was selected to one of the best engineering colleges in India -the Hindustan Institute of Technology & Science. I completed my bachelor's degree there and completed an Advanced Diploma in Hindustan Institute of Engineering Technology.

Subsequently, I did my Masters in the University of Sussex, UK and my Ph.D at New York University. I headed most of the leading construction-related institutions in Sri Lanka; a few being The National Construction Association of Sri Lanka, South Asian Lean Construction International, Master Builders International and Chamber of Construction.

**What are the most important lessons you learned at the school that moulded you into the great professional you are today?**

Because it was a mixed school, the skill and importance of teamwork and unity in extra-curricular activities struck me the most as I look back on my days at Dharmapala Vidyalaya. Whenever a teacher would administer punishment, we learned never to blame a single student. Rather, we collectively as a group received whichever punishment the teacher had decided upon.

**What are the three most important pieces of advice you can give to the next generation of Pannipitiya Dharmapala Vidyalaya?**

The first is to work purposefully towards a specific future goal. For this to be a success, you have to respect your parents, teachers, elders and colleagues. It will significantly aid you along the way. Finally, learn to not depend on others to fulfil your aims. This independence is irrevocably necessary.

**As a past pupil, you are actively engaged in many activities that are geared towards developing our school. Why do you love the school so much?**

As a specialist swimming pool consultant and engineer, helping in the school's swimming pool construction was in my realm of work, and I was happy to help. At the Schools Sportmeet, I was the House Captain of 'Soorya'. Considering my enthusiasm for sports and being an avid participator and champion of interschool championships, I am one of the members who advocated and commenced badminton as a sport in Dharmapala Vidyalaya and built it to be one of the recognised sports in the school. I distinctly remember the joy of writing, directing our dramas, from which we funded the school's first badminton court on the side of the Principal's office.

*- Hiyal Biyagamage*

DUNHINDA
GARMENTS



හොඳ ඇඳුමක්
සුව දිවියක්

සෞඛ්‍යාරක්ෂිත ළමා ඇඳුම් සඳහා
දැනට ලංකාවේ SLITA සහතිකය හිමි
එකම ආයතනය

077 379 5036
dunhindagarments@yahoo.com

M092

# පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජය කෙහෙළි නංවන ධම්පල් මිණිකැට



**ටයිකොන්ඩෝ**

**හෙසන්යා හුවින්දි වැලිකල**

**ජයග්‍රහණ:**

- ශ්‍රී ලංකා පාසල් මාර්ගගත (online) ටයිකොන්ඩෝ තරගාවලියේ ශූරතාවය
- අවු. 19 පහළ Poomsae ඉසව්වේ (දුඹුරු පටි) ප්‍රථම ස්ථානය
- අවු. 19 පහළ Speed Kicking ඉසව්වේ (දුඹුරු පටි) රන් පදක්කම
- 2020 බස්නාහිර පළාත් 46 වැනි ජාතික මහා ක්‍රීඩා උළෙල - විවෘත අංශයෙහි 53-57 බර පංතිය යටතේ පැවති ඉසව්වේ රන් පදක්කම
- 2021 මාර්ගගත කොරියානු තානාපති ටයිකොන්ඩෝ ශූරතාව - කනිෂ්ඨ අංශයේ (දුඹුරු පටි) රන් පදක්කම



**ටයිකොන්ඩෝ**

**හිරුෂි චමෝදි ගංගොඩවිල**

**ජයග්‍රහණ:**

- 2021 ශ්‍රී ලංකා පාසල් මාර්ගගත (online) ටයිකොන්ඩෝ තරගාවලියේ අවු. 19 පහළ Speed Kicking (නිල්පටි) ඉසව්වේ රන් පදක්කම
- 2020 බස්නාහිර පළාත් 46 වැනි ජාතික මහා ක්‍රීඩා උළෙලෙහි විවෘත අංශයේ 49 - 53 බර පංතිය යටතේ පැවති ඉසව්වේ රන් පදක්කම



**චෙස්**

**D. A. ඉමල්ෂි අභිෂේකා දේශානි**

**ජාත්‍යන්තර චෙස් ශ්‍රේණිගත කිරීම්**

Rapid - 1014

Blitz - 1049

**ජයග්‍රහණ:**

- ජාත්‍යන්තර චෙස් ශ්‍රේණිගත කිරීමට ලක්වූ ක්‍රීඩිකාවකි
- 2020 ශ්‍රී ලංකා ආධුනික චෙස් ශූරිය (කොළඹ දිස්ත්‍රික්කය)
- ආසියානු යොවුන් චෙස් ශූරතාවලියට සහභාගී වීම



**මලල ක්‍රීඩා**

**යොහාන් ශ්‍රී හංසක කොළඹ ආරච්චි**

**ජයග්‍රහණ:**

- 2020 වර්ෂයේ පැවැති 400 m කඩුලු මතින් දිවීමේ තරඟාවලියේ ජාතික තෝරා ගැනීම් තරඟාවලියේ විවෘත අංශයේ 07 වන ස්ථානය ලබා ගැනීමට සමත් වීම
- 2017 සමස්ථ ලංකා පාසල් මලල ක්‍රීඩා තරඟාවලියේ කඩුලු මතින් දිවීමේ ඉසව්වෙන් නව තරග වාර්තාවක් පිහිටුවීම හා එම ඉසව්වෙන් රන් පදක්කම් ලබා ගැනීම
- 2019 වර්ෂයේ ජාතික යොවුන් මලල ක්‍රීඩා සංචිතයට තේරී පත් වීම
- 2016/2017/2018 බස්නාහිර පළාත් වර්ණ සම්මාන දිනා ගැනීමට සමත් වීම
- 2017, 2018, 2019 සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා තරඟාවලියෙන් රන් පදක්කම් 03ක් සහ රිදී පදක්කමක් ලබා ගැනීම



**මලල ක්‍රීඩා**

**W.A. සෙනුරි අනුත්තරා**

**ජයග්‍රහණ:**

- 2017 ශ්‍රීමත් ජෝන් ටාබට් මලල ක්‍රීඩා උළෙලේ අවු.16 පහළ බාලිකා 100 m කඩුළු මතින් දිවීමේ නව තරඟ වාර්තාවක් පිහිටු වීම හා රන් පදක්කමක් දිනා ගැනීම
- 2018 - 2019 වර්ෂ වල අවු.18න් පහළ සමස්ථ ලංකා ජාතික මලල ක්‍රීඩා උළලේ බාලිකා 100 m කඩුලු මතින් දිවීමේ නව තරග වාර්තාවක් පිහිටු වීම හා රන්පදක්කමක් දිනාගැනීම
- 2018 වසරේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් දකුණු ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා උළෙලට සහභාගී වී එහි 4 වන ස්ථානය හිමි කර ගැනීම
- 2019 ජාතික යොවුන් මලල ක්‍රීඩා සංචිතයට තේරීපත්වීම
- 2020 වර්ෂයේදී ජාතික කනිෂ්ඨ ක්‍රීඩා උළෙලේ 100 m කඩුලු මතින් දිවීමේ නව තරඟ වාර්ථාවක් පිහිටුවීම
- කඩුලු මතින් දිවීමේ ඉසව්වෙන් 2020 දී නව තරඟ වාර්තාවක් (තත්පර 14.6) පිහිටු වීම



**චෙස්**

**තිසිත භාෂණ මිහිඳුප්‍රිය**

**ජාත්‍යන්තර චෙස් ශ්‍රේණිගත කිරීම්**

Classic - 1088

Rapid - 1096

Blitz - 1141

**ජයග්‍රහණ:**

- ජාත්‍යන්තර චෙස් ශ්‍රේණිගත කිරීමට ලක්වූ ක්‍රීඩකයෙකි
- චෙස් ගෞරව නාම: Arena FIDE Master
- 2021 බටහිර ආසියානු චෙස් ශූරතාවලියට සහභාගී වීම (16 පහළ විවෘත)
- 2019 ආසියානු යොවුන් චෙස් ශූරතාවලියට සහභාගී වීම (14 පහළ විවෘත)

**විශේෂ ස්තුතිය**

- නියෝජ්‍ය විදුහල්පති චාන්දනී හේවාගම මහත්මිය
- ක්‍රීඩා භාර නියෝජ්‍ය විදුහල්පති නිමල් වාසල මහතා
- ක්‍රීඩා පරිපාලක මාලනී යටවර මහත්මිය
- විද්‍යාලයීය සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන උපදේශක සහ මලල ක්‍රීඩා පුහුණුකරු (PTI) දුලිප් දුෂ්මන්ත පෙරේරා
- චෙස් ක්‍රීඩා පුහුණුකරු චන්දන විජේකෝන් මහතා

*- පෙවින්ද බැලගම, වත්සලා රාජගුරු*

M170

# Capital Constructions



## *Building Constructions*

House Plans / Building Plans (2D/3D) | Bill of Quantity (BOQ)

Estimating | Engineering Consultancy

House Constructions | Renovation Projects | Material Supplying

34, Circular Road,
Araliya uyana, Pannipitiya.

+94 719 122 685
+94 714 566 030

slcapitalconstruction@gmail.com

# මාර්ගගත අධ්‍යාපනය (ONLINE EDUCATION) දරුවන්ට අභියෝගයක් ද?



සොබාදහමට අනුගතව විකසිත වන කුඩා මල් කැකුළු, පරිසරයේ චමත්කාරය උකහා ගනිමින් දසත සුන්දරත්වය විඳිමින් කාලය ගත කළ දරුවන් වර්තමානයේ ඩිජිටල් අවකාශය තුළ අතරමං වී තමන්ගේ සොදුරු ළමා කාලය ගත කරයි. ඔවුන්ගේ මුවගින් දැන් නිතරම අසන්නට ලැබෙන්නේ online යන වදන් පෙළයි.

වර්තමානයේ ඇති වී තිබෙන COVID-19 ව්‍යසන තත්වයත් සමඟම වඩාත් අසරණව සිටින්නේ ඉවසා දරා ගත හැකි සීමාව නොදත් කුඩා දරුවන්ය. ළමා කාලයේ ඔවුන්ගේ සිතුවිලි, සියල්ලන් සමඟම බෙදා ගන්නට තිබෙන අවකාශය ඇහිරී ඇත. පාසල් මව් තුරුල තුළ මිතුරු මිතුරියන් හා ගුරු මෑණිවරුන් සමඟ කෙළි දොලෙන් ගත කළ කුඩා දරු පැටව් පරිගණකයේ ඇති කැමරාව තුළ සංයමයකින් පැය කිහිපයක් ඉඳගෙන සිටීමේ අසීරු කාර්යයක නිරත වී සිටී. ඔවුන්ගේ කුඩා සිත් ප්‍රායෝගික දැනුම් පද්ධතියෙන් බැහැරව, යාන්ත්‍රිකරණ දැනුම් පද්ධතියක් තුළ සිරවී ඇති අතර, ඔවුන්ගේ මිතුරෙකු බවට පත් වී ඇත්තේ පරිගනකය සහ ඩේටාය.

කෙසේ වෙතත් දරුවන්ගේ නැණස පාදා දීම සඳහා නිවෙස තුළ දරුවන්ට ඉඩ හසර ලබා දීමට දෙමාපියන් විශාල පරිශ්‍රමයක් දරනු ලබයි. ඇතැම් දෙමාපියන්ට පරිගනක තාක්ෂණය සම්බන්ධයෙන් ඇති දැනුම අල්ප වීම නිසා බොහෝ ගැටළු වලට මුහුණ පෑමට සිදුවේ. ඒ හේතුවෙන් දෙමාපිය අවධානයෙන් ගිලිහි යන කුඩා දරුවන් තාක්ෂණයේ වැරදි පැතිකඩට යොමු වීමේ ප්‍රතිශතය බොහෝ ඉහළ ගොස් ඇති අතර එමගින් දෙමාපියන් හා දරුවන් අතර සම්බන්ධතාවය ක්‍රමයෙන් ගිලිහි යන තත්වයක් වර්තමාන පරිසරය තුළ දක්නට ලැබේ.

තවද රට පුරා එක හා සමාන තාක්ෂණික පහසුකම් නොමැති වීම හේතුවෙන් දුෂ්කරතා ඇති දරුවන්ට අධ්‍යාපනය නොලැබීමේ සම්භාවිතාවය ඉහළ ගොස් ඇත. දුරකථන සංඥා නොමැති වීම හේතුවෙන් ඇතැම් දරුවන් උස් කඳු මුදුන් සහ ගස් වලට නැගීම වැනි අවදානම් සහගත තත්වයන්ට මුහුණ දීම අප රට මුහුණපා ඇති ප්‍රධානතම ගැටළුවකි.

පාසල තුළදී දරුවා හට පුහුණු වන, තමන් සතු දෑ බෙදා ගැනීම, අභියෝගයන්ට මුහුණ දීම මෙන් ම ක්‍රීඩා කුසලතා වර්ධනය කර ගැනීම යන කටයුතු වලින් දරුවා නොපනෙන මානයකට ඇදගෙන ගොස් ඇත්තේ ඉතා අවාසනාවන්ත ලෙසය. දරුවන් විසින් ඔවුන්ගේ ඒකාකාරී බව නැති කර ගැනීම සඳහා පරිගණකයේ ඇති නොයකුත් ක්‍රීඩා වැනි දේවල් වලට ඇති නැඹුරුව නිතරම දැක

1. Magic School – Mr. Sanath Gamage
   9/10/11 ශ්‍රේණි වල දරුවන්ට සහ දෙමාපියන් හට සංවිධානය කරන ලදී.
2. Magic School – Mr. Sanath Gamage
   6/7/8 ශ්‍රේණි වල දරුවන්ට සහ දෙමාපියන් හට සංවිධානය කරන ලදී.
3. Magic School – Mr. Sanath Gamage
   3/ 4/ 5 ශ්‍රේණි වල දරුවන්ට සහ දෙමාපියන් හට සංවිධානය කරන ලදී.
4. 2 ශ්‍රේණිය සඳහා සංවිධානය කරනු ලැබූ පොසොන් පොහොය වැඩසටහන.
5. 5 ශ්‍රේණිය සඳහා සංවිධානය කරනු ලැබූ පොසොන් බැති ගී සරණිය.
6. Student Motivation Programme


   2020- 11 ශ්‍රේණියේ දරුවන් සඳහා කථිකාචාර්ය අජිත් ජයවර්ධන මහතා විසින් ඉදිරිපත් කරන ලද අභිප්‍රේරණ වැඩසටහන.

   විශේෂ දේශක ලක්ෂ්මන් ගුණතිලක මහතා විසින් 10/11 ශ්‍රේණි වල දරුවන්ට සංවිධානය කරන ලද වැඩසටහන.
7. 2012-2020 විද්‍යා ගණිත අංශයේ ආදි ධර්මපාලීයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ අභිප්‍රේරණ වැඩසටහන.

   12/13 ශ්‍රේණි වල විද්‍යා ගණිත අංශයේ දරුවන්ට සංවිධානය කරන ලදී.
8. 2010-2015 වාණිජ අංශයේ ආදි ධර්මපාලීයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ අභිප්‍රේරණ වැඩසටහන.

   12/13 ශ්‍රේණි වල වාණිජ අංශයේ දරුවන්ට සංවිධානය කරන ලදී.
9. පොසොන් ධර්ම දේශනා වැඩසටහන.

   6/7/8/9/10/11/12/13 ශ්‍රේණි වල දරුවන්ට සංවිධානය කරන ලදී.
10. 1 ශ්‍රේණියේ ඇතැම් පංති සඳහා සීල සමාදාන වැඩසටහනක් පවත්වන ලදී.
11. ආදි සංකලන දරුවන් විසින් ''සංකලන- දම්පාට ගී සැදෑව'' නමින් සජීවී ප්‍රසංගයක් පවත්වන ලදී.



> කෙසේ නමුත් online තාක්ෂණය අවභාවිතයෙන් තොරව හැකි තරම් දරුවන්ගේ සුභසිද්ධිය සඳහා යෙදවීමට උත්සුක වීම වත්මන් දෙමාපියන්ට ඇති අභියෝගයක් මෙන් ම වගකීමකි.

ගැනීමට අපට හැකි වේ. මෙමගින් ඔවුන් දෙමාපියන් හා අවට පරිසරයෙන් ඈත් වී යාම මහා ඛේදවාචකයකි. ඒකාකාරී ජීවන රටාවක් තුළ සිරවී ඇති දරුවා තුළ අධ්‍යාපනය කෙරෙහි තිබූ ආශාව හා උද්වේගය අල්ප වී යාම හේතුවෙන් ඔවුන් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් බොහෝ දුරට දුරස් වීමට උත්සහ දරයි.

තවද මෙම වකවානුවේ කුඩා දරුවන් නොයකුත් මානසික සංකූලතා වලට ගොදුරු වීම හේතුවෙන් ඔවුන් කායික හා මානසික ව්‍යාකූලතා වලට පත්වීම, ක්ෂණික කෝපය, ඇස් පෙනීම දුර්වල වීම, හිසරදය, දෙමාපියන් නොරුස්සනා ස්වභාවය වැනි අතුරු ප්‍රතිඵල වලට ගොදුරු වීම ද නිතර දක්නට ලැබේ.

කෙසේ නමුත් online තාක්ෂණය අවභාවිතයෙන් තොරව හැකි තරම් දරුවන්ගේ සුභසිද්ධිය සඳහා යෙදවීමට උත්සුක වීම වත්මන් දෙමාපියන්ට ඇති අභියෝගයක් මෙන් ම වගකීමකි.

අප පාසල තුලද දරුවන්ගේ ඒකාකාරී online ඉගැන්වීම් රටාවෙන් මුදවා ගැනීම සඳහා නොයතුත් වැඩසටහන් ක්‍රියත්මක කරන ලදී. හිටපු විදුහල්පති කේ. පී. විමලසේන මහතා මෙයට පිළියම් ලෙස ඔහුගේ පූර්ණ අධීක්ෂණය මත සංවිධානය කරනු ලැබූ එම වැඩසටහන් වලින් කිහිපයක් පහත දැක්වේ.

*- තිලිණි ශ්‍යාලිකා තිලකරත්න*





| කාලය | වාර්ෂික පොලී අනුපාතය (කල්පිරීමේදී) | වා.ස.පො. |
|---|---|---|
| මාස 3 | 5.00% | 5.09% |
| මාස 4 | 5.15% | 5.24% |
| මාස 6 | 5.25% | 5.32% |
| වසර 1 | 6.00% | 6.00% |

AIBT CAMPUS

A Journey to Excellence

CERTIFIED ISO 9001:2015 COMPANY

# ASIAN INSTITUTE OF BUSINESS & TECHNOLOGY

**AIBT CAMPUS** ආයතනය ශ්‍රී ලංකාවේ ප්‍රථම පෙලේ අධ්‍යාපන ආයතනයක් වන අතර එය ජාත්‍යන්තර සංවිධාන සමග අත්වැල් බැඳගෙන ඉතා උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම ප්‍රධාන අරමුණ කරගෙන ආරම්භ කල අධ්‍යාපන ආයතනයකි.

ජාත්‍යන්තර මෙන්ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ථාපිත සංවිධාන සමග සහයෝගයෙන් හා ආයෝජනයෙන් ආරම්භ කරන ලද **AIBT CAMPUS** හි අරමුණ වන්නේ උසස් තත්වයේ හා ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනයක් තුලින් සිසුන්ට ඔවුන්ගේ වෘත්තීමය රැකියා ජීවිතය දියුණු කිරීමට හා ගොඩනැගීමට අවස්ථාවක් ලබා දීමයි. ආයතනයේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ වෙහෙස මහන්සි වී වැඩකරන දුවා දරුවන්ගේ අරමුණු ඉටු කරගැනීමට අත්වැලක් සැපයීමයි, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඒ සදහා අවස්ථාවක් ලැබිය යුතු බවත් තමාට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම දැරිය හැකි සාධාරණ ගාස්තුවක් යටතේ සහනදායී මිලකට වාරික වශයෙන් ගෙවීමට අවස්ථාව ලබා දීමයි. තවද, අප ආයතනය මගින් ණය යෝජනා ක්‍රම ඔස්සේ තමා තෝරා ගන්නා ලද පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා දී ඇත.

**AIBT CAMPUS** විසින් ව්‍යාපාර හා කළමණාකරණය, තොරතුරු තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය, මානව සම්පත් කළමණාකරණය, මනෝ විද්‍යාව වැනි ක්ෂේත්‍ර අධ්‍යයනය, පුහුණුව සහ මුල් වසරවල විවිධ පිළිගත් ජාත්‍යන්තර ඩිප්ලෝමා, උසස් ජාත්‍යන්තර ඩිප්ලෝමා සහ උපාධි, ශාස්ත්‍රපති, ආචාර්ය උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි.

අපගේ වැඩසටහන් අධ්‍යාපනයෙන් ඉතා උසස් ගුණාත්මක භාවයකින් යුතු වන අතර එම පාඨමාලා සංවර්ධනය කරනු ලබන්නේ ජාත්‍යන්තර විශේෂ නිපුණතාවයක් ඇති පළපුරුදු අධ්‍යාපනඥයින්, විවිධ ක්ෂේත්‍රයන්හි කාර්ය සාධනය පිළිබඳ සනාථ කරන ලද වෘත්තිකයන් විසිනි.

එසේම වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන්නේ මිශ්‍ර ඉගෙනුම් ප්‍රවේශයකින් වන අතර විශ්ව විද්‍යාලය තුල ඉගෙනීමටත්, අපගේ පීඨ සමග මුහුණට මුහුණලා කටයුතු කිරීමටත්, තාක්ෂණය තුළින් වැඩසටහන් වලට ප්‍රවේශ වීමටත්, ඔවුන් රැකියාවක නිරත වන්නේ නම් රැකියාව සමග ඉගෙන ගැනීමේ කටයුතු එකට කරගෙන යාමටත් ඉඩ පහසුකම් සලසා දී ඇත.



**Dr. Mohan Pathirana**
**Vice Chairman**
Doctor (Honoris Causa)
Middlesex University UK,
MBA (Col, B.E. (Hons)
Eng. Fellow (Honorary)
Cardiff Metropolitan
University UK



**Varuna Wickramasinghe**
**Cheif Executive Officer**
MBA(Sp),
Mkt (Sikkim Manipal Uni.),
MSLIM, MACS,
AICM (UK), ADNIIT

chatham UNIVERSITY · UCAM UNIVERSIDAD CATÓLICA DE MURCIA · UK AWARDS Education Excellence · LONDON EXAMINATIONS BOARD · EduQual · VERN' · BRITTANY Université




පහත සඳහන් පාඨමාලාවන් ආයතනයේ දැනට පවත්වාගෙන යනු ලබයි.

### Diploma Programmes

Information Communication Technology,
Human Resource Management,
English / Spoken English /
Advanced Diploma in English,
International English Language
Testing System (IELTS)

### Higher International Diploma Programmes (Level 5)

Quantity Surveying
Computing & Software Engineering
Business and Marketing

### Post Graduate Diploma Programmes (Level 7)

Accounting & Finance
Business & Marketing Strategy
Business Management
Human Resource Management
Islamic Banking & Finance

### Masters Programmes

Dual Award in Master of Education (M.Ed)
Dual Award in Master of
Business Administration (MBA)
American MBA
Dual Award Master of Arts in TESOL
(Teaching English to Speakers
of other Languages)

### Doctoral Programmes

Dual Award Doctor of Business Administration (Dual DBA)
Triple Award Doctor of Business Administration (Triple DBA)
Doctor of Philosophy (PHD)

M062

**077 259 9436 / 077 598 8978 / 0112 098 841**

AIBT CAMPUS
A Journey to Excellence

30% OFF

**AIBT Campus hereby awards a discount of 30% to follow any program in**

**Diploma Programmes**
**Higher International Diploma Programmes**
**Post Graduate Diploma Programmes**
**Masters Programmes**


**Please submit this discount voucher at the time of registration.**

***Conditions apply**

M162

Lavenderlize

# ONLINE SHOPPING



M147

# TECHNOLOGICAL INNOVATION
## GROWN ON SRI LANKAN SOIL



We are a pioneering and groundbreaking Tech Solutions Leader in Asia. We have disrupted the global status quo with consistency and focus for over a decade, creating norm-shattering innovations. While we are cutting-edge and global in our outlook we remain deeply steeped in Sri Lankan tradition and culture. Let us point your growth trajectory to unprecedented heights with tech solutions curated for your needs with our unique design anthropology study.

Contact us today and let us reimagine your future.

arimac

Scan here & enter the Arimac World

**Arimac Digital** No 02, 6th Lane, Colombo 03, Sri Lanka. T +94 115 219 554 E hello@arimaclanka.com W www.arimaclanka.com



**Chamira Jayasinghe**
Chief Executive Officer of Arimac

# DRIVING A NEW WAVE OF 'DIGITALLY-AGILE' INNOVATIONS AS A RESPONSE TO COVID-19

Chamira Jayasinghe, a proud past pupil of Pannipitiya Dharmapala Vidyalaya and the Chief Executive Officer of Arimac, Sri Lanka's premier end-to-end digital solutions provider, pens down his thoughts on how technology will play a critical role in supporting the future resilience of Sri Lanka's economy.

COVID-19, the current global pandemic that has created greater chaos, forces every individual and organisation to think out-of-the-box. When chaos is in the spotlight, two scenarios will be up for grabs: for those who can adapt as the opportunities will be countless, and for those who cannot, it could be a disaster. In such a context, businesses need to position their rationale to be on the front foot, prioritising 'Digital Agility' in this time of uncertainty.

From new ways of working remotely to building detectors that identify people without masks, we are talking about a new cultural revolution that COVID-19 has brought forward. This revolution is significantly enabled by an outpour of creativity, which ushered in a new era of 'digitally agile' innovations. These new solutions are showcasing what human ingenuity is capable of in the face of adversity.

Any period of volatility can create opportunities that businesses can leverage if they are prepared. In the case of the COVID-19 outbreak, organisations that take a more assertive and longer-term approach through IT agility can spark innovations. During the pandemic, companies have been creative in driving their organisations towards innovative thinking within their businesses; it also enforces the fact that organisations must be ready to present increasing digital capabilities and experiences for their customers to produce inspiring and digitally-agile innovative responses.

## DIGITALLY-AGILE SOLUTIONS TO FIGHT THE PANDEMIC

As a business that follows modern agile technology practices, Arimac Digital utilises digital service offerings and create solutions for different stakeholders–be it for citizens, governments or industries–to improve and augment their experience.

We had the privilege to be a part of the government's ongoing operations in their battle against COVID-19, offering our expertise on using smart innovations to help tackle this current challenge. The creativity and ingenuity we bring through agile digital operations helping local organisations and global private and public firms. All these projects were carried out free of charge to support individuals and companies to stand on their feet at this challenging time.

Below are some of the critical projects we have been proud of spearheading as a team, during the last two months:

### Developing a Contact Tracing App

Taking proactive measures is the most vital component in our conquest to stop the spread of the COVID-19 virus. Together with the Presidential secretariat task force that was established to combat COVID-19, we developed "Together WeCan" app. The app is designed to identify both the proximity and the duration of the encounters with nearby users via Bluetooth Based Tracking.

### Web Solutions that provide real-time information

Our talented team has worked tirelessly with the Ministry of Health in Sri Lanka and the Health Promotion Bureau (HPB) to revamp their official website. We created a portal where individuals can get verified and accurate data, symptoms of COVID-19, hotlines for emergencies, prevention methods and FAQs on COVID-19.

To add more value to the partnership with HBP, we created a public forum/community group through Viber to generate awareness on key safety measures and providing verified data on the situation of the virus. Furthermore, the studio division of Arimac created informative and fun-filled animations and posters to build COVID-19 awareness through an interactive learning process.

### Open APIs playing a pivotal role

Arimac identified the lack of a verified data source on the COVID-19 situation in Sri Lanka, and by collaborating with HPB, we created an API that is publicly open to developers with accurate LIVE data for any entity to extract the latest and accurate data. This is being used presently as Sri Lanka's main source of information regarding the pandemic.

### An all-new COVID-19 dashboard

We have created a sophisticated dashboard to monitor the COVID-19 situation in the country. This dashboard comes with several features which allow the users to get live updates and analyse the situation.

### Games to build awareness

We have designed engaging games to attract the right target audience to spread awareness of this pandemic by utilising Facebook. Arimac is also currently creating an awareness-based game on COVID-19 for the World Health Organization (WHO), which will be made available through the social media channels of WHO.

Apart from these projects, we are also involved in discussions with Maldives, Algeria, Laos and Qatar to enable these countries with state-of-the-art digital solutions to combat COVID-19 in their respective countries.

### A NEW PATH FOR DIGITAL TRANSFORMATION

COVID-19 is a dark cloud, but even within that obscurity, there is a bright, silver lining that is the spur of effort and spirit for digital innovations. With numerous digital developments taking place, many firms have become more conscious of the need for a strong case of digital transformation. When businesses start to recover from the aftermath of this pandemic slowly, business priorities will gradually shift, making a digital transformation a case of 'when', not 'if'.

When developing digital government strategies post COVID-19, the focus should be on improving data protection and digital inclusion policies as well as on solidifying the policy and technical capabilities of public institutions. Public-private partnerships will also be essential for implementing innovative technologies and tailoring digital solutions to countries' needs. The COVID-19 pandemic has emphasised the importance of technology but also the pivotal role of an effective, inclusive and accountable government.

At times of crisis, it is really important that private sector companies bring about innovations or integrate the already existing technology to make it more disruptive and convergent – not solely to capitalise on it, but to pay more attention on how it can benefit society. Agility, or the ability to respond promptly via technology, not only helps the country to be aware of the current situation but, in the future, will also be able to prevent an oncoming issue in the foreseeable future.

To reemerge from the challenges and constraints imposed by COVID-19, organisations like Arimac will come forward on a much bigger scale to support the government in reviving the economy and rebuilding the society by sharing technologies, tools and expertise. In the long term, the government would also need accelerate the implementation of innovative digital technologies like artificial intelligence (AI), machine learning and Internet of Things (IoT). We have in-house experts on these technologies where we would like to engage with the government to create long-term roadmaps as these technologies can tremendously support the future resilience of Sri Lanka's economy.






2021/2022

# පේරමග කතාව

The Story of Peramaga for the Administrative Year 2021/2022



පෙරමග දශක කණ්ඩායමේ 2021/2022 පරිපාලන වර්ෂයේ විධායක කමිටුව සඳහා සාමාජිකයින් 66 දෙනෙක් විසින්, තනතුරු ස්ථාන 91 කට සිය කැමැත්තෙන්ම නාම යෝජනා ඉදිරිපත් කරන ලදී. එවැනි තරඟකාරීත්වයක් සහිතව, විධායක සභාවේ සේවය වෙනුවෙන් උද්යෝගයෙන් කැපවීම සඳහා තේරී පත්වූ විධායක සභිකයින් 35 දෙනෙකුගෙන් යුත් විධායක සභාව විසින් සභා සම්මත කරගත් ව්‍යාපෘති/වැඩසටහන් විදුහල්පති සහ ආදි ශිෂ්‍ය සංගමය වෙත ඉදිරිපත් කරන ලද අතර, එම සියලු කරුණු ඔවුන් විසින් විරුද්ධත්වයකින් තොරව අනුමත කළහ. ඊට අමතරව, විදුහල්පති සහ මව් සංගමය විසින් යෝජිත ව්‍යාපෘති/වැඩසටහන් කිහිපයක්ද අප විසින් ක්‍රියාත්මක කරන ලදී.

විශේෂයෙන් ම, මෙම පරිපාලන වර්ෂයේදී නව මූල්‍ය උත්පාදන ව්‍යාපෘති හතරක් ක්‍රියාවට නැංවීම වඩාත් සුවිශේෂී කාරණයක් ලෙස පෙන්වාදීමට කැමැත්තෙමි. ඒ සියල්ල පිළිබඳ කෙටි විස්තරයක් පහතින් ඉදිරිපත් කර ඇති අතර, මෙම සියලු ව්‍යාපෘති සාක්ෂාත් කරගැනීමට 2021/2022 පරිපාලන වර්ෂයට අදාල පෙරමග විධායක කමිටුවේ සහෘදයින් මෙන් ම පෙරමගට ලැදි, ධර්මපාලයට ලැදි, ආදි ධර්මපාලීයයන් විශාල ප්‍රමාණයක්ද වෙහෙස මහන්සි වූ බව සඳහන් කළ යුතුමය.




## MERCH PACK
## වෙළෙඳ භාණ්ඩ එකතුව

(මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

වර්තමාන සභාපතිතුමාගේ සංකල්පයක් පරිදි, දම්පල් ආදි ශිෂ්‍යයින් වෙනුවෙන්ම ඉතා උසස් තත්ත්වයේ නිමාවකින් යුත් අයිතමයන් කිහිපයක එකතුවක් ලෙස "Merch Pack" යන සන්නාම නාමය යටතේ ක්‍රියාත්මක වන සුවිශේෂී ව්‍යාපෘතියකි. පහත දක්වා ඇති අයුරින් පිරිමි පාර්ශවයට අයිතම කට්ටල (Normal & VIP) දෙකක්ද, ගැහැණු පාර්ශවයට අයිතම කට්ටල (Normal & VIP) දෙකක්ද නිකුත් කර ඇත.

**Ladies Normal Pack -** Batik Saree, Brooch (Saree Pin), Lunch Bag

**Ladies VIP Pack -** [Ladies Normal Pack] + Pen Drive, Watch, Mug

**Gents Normal Pack -** Shirt (Long Sleeves), Tie, Tie Pin, Cufflinks, Lunch Bag, Pen Drive

**Gents VIP Pack -** [Gents Normal Pack] + Watch, Mug, Ink Pen, Card Holder, Key Tag

මෙම පරිපාලන වර්ෂයේ එක් ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් වන මෙම ව්‍යාපෘතියේ පළමු අදියර මේ වන විට පූර්ව ඇණවුම් (Pre Order) ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන අතර, නොවැම්බර් මාස අවසාන භාගය වන විට, ව්‍යාපෘතියේ දෙවන අදියර දියත් කිරීමට කටයුතු සලසා ඇත.

දෙවන අදියර මගින් අනෙකුත් දශක කණ්ඩායම්වල සාමාජිකයින්, නවක ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සහ නවක උපාධිධාරීන් ඉලක්ක කිරීමට බලාපොරොත්තු වේ. තුන්වන අදියර ලෙස පෙරමග දශක කණ්ඩායමේ වෙබ් අඩවිය හරහා විකිණුම් සිදුකිරීමට කටයුතු සම්පාදනය කර ඇති අතර, එමගින් ප්‍රථමයෙන්ම අයිතම කට්ටල වශයෙන්ද, දෙවනුව තනි අයිතම බැගින්ද විකිණුම් කටයුතු සිදු කරනු ඇත.

### පෙරමග සඟරාව
(මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

මෙය පෙරමග දශක කණ්ඩායමේ තුන්වන වාර්ෂික සඟරාවයි. පෙරමග දශක කණ්ඩායමේ පළමු සඟරාවේ සංස්කාරක හැටියට එවකදී මා විසින් සඟරාව පිළියෙල ක වකවානුවේදී, මාගේ සහෘදයින් හා පැවසූ පරිදිම, මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් හැටියට මෙම වසරේ දී මෙම ව්‍යාපෘතිය මුල්තැනක් ගැනීම පිළිබඳව නිහතමානීව සතුටු වෙමි. එමෙන් ම ව්‍යාපෘතිය ආරම්භයේදී කථිකා කරගත් මූල්‍යමය ඉලක්කය අභිබවායාම පෙරමග සාමාජිකයින්ගේ ශක්තිය තවත් අයුරකින් විදහා පෑ බව කිවයුතු මනාය.




2021/2022 පරිපාලන වර්ෂයේ ව්‍යාපෘති පිළිබඳ විස්තර කිරීම, පෙරමග දශක කණ්ඩායම ආරම්භයේ සිටම මේ දක්වා සිදු කළ ව්‍යාපෘති පිළිබඳව කෙටි මතක් කිරීම, සුවිශේෂ ධර්මපාලීයයන්ගේ සම්මුඛ සාකච්ඡා, කාලීන විශේෂාංග ලිපි, ක්‍රියාකාරකම් සහ වෙළෙඳ දැන්වීම් යනාදිය සඟරාවේ ප්‍රධාන අන්තර්ගතයන් ලෙස පෙන්වාදිය හැක.

### FEATURED ARTICLE VIDEOS
(මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

පෙරමග සඟරාවේ සුවිශේෂී ධර්මපාලීයයන්ගේ සම්මුඛ සාකච්ඡා යන මැයෙන් ලිපි කිහිපයක් පළ කරන ලදී. ඒවා අතරින් තෝරාගත් ලිපි කිහිපයක් වීඩියෝ ලෙස නිෂ්පාදනය කර YouTube, Facebook, Instagram, Viber,




WhatsApp වැනි සමාජ ජාල හරහා ප්‍රචාරය කරනු ඇත. එම වීඩියෝ වල වෙළෙඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම මගින් මූල්‍ය උත්පාදනය කිරීම සිදු කෙරේ. මෙය පෙරමග සඟරාව හා සමගාමීව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

### පාසල ඉදිරිපස බස්නැවතුම්පළක් ඉදිකිරීම
(මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

අප පාසලේ දරු දැරියන්ගේ සුරක්ෂිතභාවය පදනම් කර ගනිමින් සහ අව්-වැසි අවස්ථා වල අවශ්‍යතාවයක් ලෙස, පාසල ඉදිරිපස බස් නැවතුම්පළක් ඉදිකිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතියි. එමෙන් ම බස්නැවතුම්පළ ගොඩනැගිල්ලේ



ස්ථාන කීපයක අලෙවිකරණ (Branding for Marketing) අරමුණ උදෙසා කොටස් වෙන් කර එම කොටස් වෙනත් පාර්ශවයන් හට ගිවිසුම් පදනම (පිහිනුම් තටාකය අබියස ඇති එළිමහන් නාමපුවරු ආදිය සංවර්ධන භාරකාර අරමුදල සමග සම්බන්ධව, වෙනත් ආයතනයන්ට කුලී පදනම යටතේ ලබාදෙන ආකාරයට) යටතේ ලබාදීමෙන් මූල්‍ය උත්පාදන කටයුතු සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ දෙවෙනි අරමුණයි.

### ගෘහස්ථ සංගීත ප්‍රසංගය
(මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

සාමාන්‍යයෙන් මෑත වර්ෂ කිහිපයේම ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය ලෙස ගෘහස්ත සංගීත ප්‍රසංගය ක්‍රියාත්මක කරන ලදී. නමුත් පසුගිය වකවානුවේ පැවති සහ දැනට පවතින




"Sarigama by Peramaga" is the code name of this project

(2021 නොවැම්බර්) වසංගත තත්ත්වය යටතේ ගෘහස්ත සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට හැකියාවක් නොපවතියි. නමුත් වර්ෂය මුලදී සාකච්ඡා කරගත් පරිදි ගෘහස්ත සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට හැකියාව ලද විගසම, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු සම්පාදනය කර අවසන්ය.

### සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය
(මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

පෙරමග දශක කණ්ඩායමේ අනන්‍යතාවයක් ලෙස 'සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය' හඳුන්වාදිය හැක. ව්‍යාපෘති/වැඩසටහන් පෙළගැස්මට අනුව 2021 මැයි මාසයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබුණද, රටේ පැවති තත්ත්වය හමුවේ එය කල්දැමීමට සිදුවූ නමුත්




හැකියාව ලද විගසම 'සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය' පැවැත්වීමට නියමිතය.

පසුගිය වර්ෂයන්හිදී මෙම තරඟාවලිය සඳහා කණ්ඩායම් 25-30ත් අතර ප්‍රමාණයක් සහභාගී විය. මෙම වැඩසටහනේ මූලික අරමුණු ලෙස සාමාජිකයින්ගේ සුහදත්වය සහ එකමුතුකම වර්ධනය කිරීම මෙන් ම, පෙරමග සාමාජිකයින්ට ඒකරාශී වීමට අවස්තාවක් සලසා දීම පෙන්වා දිය හැකිය. තරඟාවලියට සමගාමීව එදිනම 'පෙරමග Membership Hut' වැඩසටහන හරහා සාමාජික ප්‍රවර්ධන කටයුතු සිදුකිරීමද වසර තුනක් මුළුල්ලේ සිදුකෙරේ.

### මුව ආවරණ ව්‍යාපෘතිය
(මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

දුලාන් දර්ශන මහතාගේ අනුග්‍රහයෙන් නිෂ්පාදනය කරන ලද මුව ආවරණ පළමු කාණ්ඩයේ මුව ආවරණ යම් ප්‍රමාණයක් මේ වර්ෂය දක්වා ඉතිරි වන ලදී. නමුත් එම ඉතිරිව තිබූ මුව ආවරණ සියල්ල මේ වසරේ දී පාසලේ සිසු සිසුවියන් අතරේ විකුණා අවසන් කළේය. මුව ආවරණ මෝස්තරය වෙනස් කර දෙවන කාණ්ඩය මෙම වසරේ අප්‍රේල් මාසයේදී නිෂ්පාදනය කරන ලදී. එසේ නිෂ්පාදනය කරන ලද දෙවන කාණ්ඩය, මේ වන විට විකුණුම් ක්‍රියාවලියට යොමු කොට ඇත.




මේ දක්වා පැවති සියලු අවස්ථාවන් වල දී (පළමු වසර ළමුන් ඇතුලත් කරගැනීම, පාසල තුළ ක්‍රියාත්මක වූ ශ්‍රමදාන ව්‍යාපෘති, උසස් පෙළ ළමුන් ඇතුලත් කරගැනීම වැනි අවස්ථා) මුව ආවරණ විකිණීමේ කටයුතු උප භාණ්ඩාගාරිකතුමාගේ අධීක්ෂණය යටතේ සිදු කළේය.

### T SHIRT PROJECT
(සාමාන්‍ය මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියකි)

පෙර වර්ෂයන් වල ප්‍රධාන මූල්‍ය උත්පාදන ව්‍යාපෘතිය වන ගෘහස්ථ සංගීත ප්‍රසංගයන් වල ක්‍රියාත්මක කරන ලද අතුරු ව්‍යාපෘතියක් වන ටී ෂර්ට් ව්‍යාපෘතිය, වසරේ මුල් භාගයේදීම ක්‍රියාත්මක කරන ලදී. විධායක සභිකයින් හට එක් මෝස්තරයකුත්, අනෙකුත් සාමාජිකයින් හට තවත් මෝස්තරයකිනුත් නිෂ්පාදනය කර,



සියලුම ටී ශර්ට් මාස දෙකක් වැනි සුලු කාලයකදී බෙදාහරින ලදී. මෙම ව්‍යාපෘතිය වර්තමාන භාණ්ඩාගාරිකතුමා විසින් මෙහෙයවන ලදී.

### පෙරමග වෙබ් අඩවිය

https:/peramagadvp.org

අප දශක කණ්ඩායමට අයත් වෙබ් අඩවිය නව මුහුණුවරකින්, නව පහසුකම් රැසක් සහිතව, නව වෙබ් ලිපිනයක් හරහා සමාජගත කරන ලදී. මෙහිදී නවක සාමාජිකයින් හට වෙබ් අඩවිය හරහාම සාමාජිකත්වය ලබාගැනීමට හැකි වන ලෙස පහසුකම් සපයන ලදී.




### SOCIAL MEDIA ඉදිරි පිම්ම

පෙරමග දශක කණ්ඩායමේ වැඩසටහන්, ව්‍යාපෘති ආදී තොරතුරු සමාජගත කිරීම සඳහා සමාජ මාධ්‍යයන්ද යොදාගන්නා ලදී. එහිදී Facebook සහ Viber යන සමාජ මාධ්‍ය මෙතෙක් කාලයක් භාවිතා කළ නමුත්, කාලයත් සමග සමාජ මාධ්‍ය වල සිදුවූ වෙනස්කම් සහ වැඩිදියුණුව නිසා Facebook සහ Viber වලට අමතරව Instagram, WhatsApp, සහ Youtube යන සමාජ මාධ්‍යයන්ද යොදාගැනීම ආරම්භ කරන ලදී.



***YouTube*** : Peramaga Decade Group - DVP
***Instagram*** : @peramaga.dvp
***WhatsApp*** : Peramaga Members Official
***Viber*** : Peramaga Members Official
***Facebook*** : PERAMAGA DVP (Page)
***Facebook*** : Peramaga Dvp II (Profile)

### පෙරමග ගබඩා කාමරය

අප දශක කණ්ඩායම විසින් පාසල තුළ අනෙක් කණ්ඩායම් වලට සාපෙක්ෂව වඩා වැඩි ව්‍යාපෘති ප්‍රමාණයක් සිදුකරන බව නොරහසකි. අප විසින් ක්‍රියාත්මක කරන සමහර ව්‍යාපෘති අවසානයේදී



ඉතිරිවන අමුද්‍රව්‍ය, භාවිත කළ ආම්පන්න යනාදිය ගබඩා කර තබාගැනීම මගින් වියදම් ඉතිරි කරගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථයයි. එමෙන් ම පෙරමග වත්කම් වන Membership Hut කුඩය, හකුලන මේසය සහ කැනපිය ආදී ප්‍රමාණයෙන් විශාල ද්‍රව්‍යද, නැවත පාවිච්චි කිරීමට අවශ්‍යතාවයක් පැන නගින තුරු මෙහි සුරක්ෂිතව තැන්පත් කර ඇත.

### අලුත්වැඩියා කිරීමේ කටයුතු

විද්‍යාලයීය ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකයේ, පරිගණක විද්‍යාගාරයේ සහ එම ගොඩනැගිල්ලේ තරප්පු පද්ධතියේ බිත්ති අලුත්වැඩියා කොට තීන්ත ආලේප කිරීමේ කටයුතු සිදු කරන ලද්දේ 2021/2022 පරිපාලන වර්ෂයේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙසයි. මේ සඳහා සාමාජිකයින් විශාල ප්‍රමාණයක් දවස් කිහිපයක් තිස්සේ වෙහෙස මහන්සි විය.



### වැසිකිළි පද්ධතිය පිළිසකර කිරීම

(10-11 ශ්‍රේණි සඳහා)

2021/2022 පරිපාලන වර්ෂයේ දෙවන ව්‍යාපෘතිය මෙයයි. පුස්තකාල ගොඩනැගිල්ලට පහළින් ඇති අබලන් වූ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා



කොට නැවත භාවිත කළ හැකි පරිදි සකසා, නව තරප්පු පේළියක් මගින් එයට ඇතුලු වීමට වෙනත් පිවිසුමක් ඉදිකරනු ලැබී ය.
මෙම සියලු අලුත්වැඩියා සහ ඉදිකිරීම් කටයුතු පාසල් පරිපාලන ඒකකය විසින් අප වෙත ලබාදුන් පිඹුරු පත් සහ ඇස්තමේන්තු වලට අදාලව සිදු කරනු ලැබූ අතර, 10-11 ශ්‍රේණි සඳහා මෙම වැසිකිළි පද්ධතිය වෙන් කිරීමට නියමිතය.

### ක්‍රීඩා පිටියේ බෑවුම් භූමිය ක්‍රමවත් කිරීම

ධර්මපාල මාවතට යාබද පිට්ටනියේ බෑවුම සේදීයාම වැලැක්වීම සඳහා, බෑවුමේ අඩුතැන් සකසා පස සැකසීම එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදාගනිමින් සිදු කරන ලදී.



### අබලන් පුටු සහ මේස පිළිසකර කරදීමේ ව්‍යාපෘතිය

නොකඩවා වසර හතරක් පුරාවට සිදුකරන මෙම ව්‍යාපෘතිය කාලීනව ගත්කළ මහත් වැඩදායී ව්‍යාපෘතියක් බවට බොහෝ දෙනෙකුගෙන් පැසසුම් ලද ව්‍යාපෘතියකි. සාමාන්‍යයෙන්, පරිපාලන වර්ෂයක් තුළ දෙතුන් වතාවක් පමණ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය, ඔක්තෝම්බර් මාසය වන විට දෙවතාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී සාමාන්‍ය පන්තිකාමර වල පවතින අබලන් වූ පුටු සහ මේස මෙන් ම, විද්‍යාගාරයන්හි, පුස්තකාලයන්හි සහ ගුරු විවේකාගාරයන්හි ඇති කුෂන් පුටුද අලුත්වැඩියා කොට නැවත පරිහරණය කළ හැකි ලෙස සාදා නිමකරන ලදී.




### සුගතපාල මහතාගේ නිවසේ සිවිලිම සවිකිරීම

වර්තමාන සභාපති පෙවින්ද බැලගම මහතාගේ අදහසක් පරිදි, පසුගිය වසරේ දී සුගතපාල මහතාගේ නිවස අලුත්වැඩියා කොට නැවත



භාරදෙන ලදී. නමුත් සිවිලම ස්ථාපනය කොට තිබූ නොමැති බැවින් පළමු විධායක සභා රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කොට අලුතින් සිවිලිමක් ස්ථාපනය කිරීමට එකඟත්වයකට පැමිණෙන ලදී. ඒ අනුව, අංගසම්පූර්ණ ලෙස සිවිලිමක් ස්ථාපනය කොට වැඩ අවසන් කරනු ලැබී ය.

## 'ඉගෙනුමට සවියක්' ශිෂ්‍යත්ව වැඩසටහන

දැනට වසර දෙකක් මුළුල්ලේ සිදුකරගෙන එන මෙම වැඩසටහන මෙම පරිපාලන වර්ෂයේදීත් සිදු කරන ලදී. ශිෂ්‍යත්වලාභී සිසුන්ගේ වෙනස්වීම් කිහිපයක් සිදුවූ අතර, එම පුරප්පාඩු සඳහා විදුහල්පතිතුමා විසින් නිර්දේශිත නව සිසුන් කිහිප දෙනෙක් එකතු කරන ලදී. ඒ අනුව රු. 30,000/- ක ශිෂ්‍යත්ව මුදලක්, අධ්‍යාපන හා ක්‍රීඩා දක්ෂතා සහිත ආර්ථික අපහසුතාවයන්ගෙන් පෙළෙන සිසු සිසුවියන් 11 දෙනෙකු අතරේ මාසිකව බෙදාදෙනු ලැබේ.

## ජාත්‍යන්තර ක්‍රීඩා තරඟයකට සහභාගී වන ධර්මපාලීයයකුට අනුග්‍රහය දැක්වීම

බංගලාදේශයේ ඩකා නුවර පැවති මධ්‍යම දකුණු ආසියානු ජිම්නාස්ටික් තරඟාවලිය සඳහා ජාතික ජිම්නාස්ටික් ක්‍රීඩකයෙකු ලෙස රවිඳු සසංක ශිෂ්‍යයා අප පාසල නියෝජනය කරන ලදී. එහිදී ඔහුගේ තරඟාවලියේ වියදම් සඳහා මූල්‍යමය අනුග්‍රහයක් දැක්වීම විධායක කමිටුවේ බහුතර කැමැත්ත මත සිදුවිය.



## ක්‍රීඩා උපකරණ සහ වැඩපොත් කට්ටල පාසලට ලබාදීම.

ක්‍රිකට් ක්‍රීඩකයින් සඳහා ලෙදර් බෝල කිහිපයක්ද, 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් හට වැඩපොත් කට්ටල කිහිපයක්ද, පෙරමග සාමාජිකයෙකුගේ අනුග්‍රහයෙන් පාසලට ලබාදෙන ලද්දේ මාර්තු මාසයේදීය.



## ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 157වන ජන්ම දින සැමරුම

මව් සංගමය විසින් සංවිධානය කරන ලද මෙම උත්සව අවස්ථාව සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් සියලු සෞඛ්‍ය නීති වලට යටත්ව පවත්වන ලද්දේ සැප්තැම්බර් 17 වෙනිදාය. ධර්මපාල ප්‍රතිමාවට උපහාර දක්වා රුක් රෝපණයන් කිහිපයක්ද සිදු කළ පසු, දහවල් සාංඝික දානය පිරිනැමීමෙන් අනතුරුව කටයුතු නිමාකරන ලදී. මෙහිදී අටපිරිකර දෙකක්ද, කාලීනව වැදගත් වන අංගසම්පූර්ණ ප්‍රථමාධාර කට්ටල 10ක්ද පිරිකර වශයෙන් පූජා කිරීම පෙරමග දශක කණ්ඩායම විසින් සිදුකරන ලදී.



## හරිත ව්‍යාපෘතිය

ආරම්භයේ සිටම ධර්මපාලය යනු සුන්දර පරිසරයකට උරුමකම් කියන රම්‍ය විදුහලකි. එහි ඇති සුන්දරත්වය තවත් වර්ණවත් කිරීමට පෙරමග විසින් ක්‍රියාත්මක වන හරිත ව්‍යාපෘතිය



මගින් පාසලේ තෝරාගත් ස්ථාන කිහිපයක මල්පැල ස්ථාපිත කිරීම සිදුකරන ලද්දේ 2019 වසරේදීය. එම මල්පැල නඩත්තු කිරීම මෙම වසරේදීද අවස්ථා කිහිපයකදී සිදු කළ අතර, ඊට අමතරව ක්‍රීඩාපිටිය අසල පළතුරු පැල සිටුවීමද මීට සමගාමීව සිදු කරන ලදී.

## පාසලේ පරිසර පද්ධතිය නඩත්තු කිරීමේ කටයුතු

පාසල් පරිසරය නඩත්තු කිරීමේ කටයුතු වලින් සමහරක්, වසරේ මැද භාගයේදී වසංගත තත්ත්වය හේතුවෙන් ඇණහිට තිබුණි. ඒ සඳහා




පිළියමක් වශයෙන් මුලු පාසලේම තණකොළ කපා පිරිසිදු කිරීම සිදු කළේය. ඊට අමතරව පාසල් භූමියේ ඇති ගස් වලින් කපා ඉවත් කර තිබූ අතු රාශියක් සුදුසු ස්ථාන වලට ඒකරාශී කොට පුලුස්සා දමන ලදී. නොවැම්බර් මාසයේදී පාසල් ආරම්භ කරන අවධිය වන විට, මෙහි දෙවන අදියර ලෙස නැවතත් මුලු පාසලේම තණකොළ කපා පිරිසිදු කරන ලදී.

## පෙරමග සමාජ සත්කාර
### පළමු අදියර

අ). විදුහල්පතිතුමාගේ අනුදැනුම පරිදි පාසලේ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවය කරන චන්ද්‍රපාල මහතාගේ නිවස අලුත්වැඩියා කිරීම පෙරමග දශක කණ්ඩායම මගින් සිදුකරන ලදී. මෙහිදී එම නිවසේ වහලය අලුතින් නිමකර, බිත්තිය ගල් දෙකක ප්‍රමාණයකින් උස්සා, බිත්ති කපරාරු කර, තීන්ත ආලේප කර උසස් නිමාවකින් යුතුව ඔවුනට නැවත භාරදෙන ලදී.



ආ). පාසලේ අනධ්‍යයන අංශයේම සේවය කරන සිරියා මහත්මියගේ නිවසේ දොරවල් සහ ජනෙල් නොමැති බව විදුහල්පතිතුමා මගින් පෙරමග දශක කණ්ඩායම වෙත දැනුම් දෙන ලදී. ඒ පිළිබඳව සොයාබලා දොරවල් සහ ජනෙල් අලුතෙන්ම සවිකර දීම පෙරමග දශක කණ්ඩායම විසින් සිදු කරන ලදී.



## පෙරමග සමාජ සත්කාර
### දෙවන අදියර


මොණරාගල, බඩල්කුඹුර, මඩුකොටංඅරාව මහා විද්‍යාලයේ සිසු සිසුවියන් (1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා) සඳහා අභ්‍යාස පොත්, චිත්‍ර



පොත්, පෑන්, පැන්සල්, කතුරු, ගම්බෝතල්, 6" කෝදු, මකන, කටර්, කවකටු පෙට්ටි, සිතියම් පොත්, ගණක රාමු, පැස්ටල් පෙට්ටි, හිදැස් පත්‍ර, හැඩතල එකතු, හාෆ් ෂීට් කොළ (A4 Bundles) යනාදිය පරිත්‍යාග කරන ලදී. කාර්යාලීය පාවිච්චිය සඳහා මුව ආවරණ ඇතුළු අංගසම්පූර්ණ ප්‍රථමාධාර කට්ටලයක්ද කාර්යාලීය ලිපිද්‍රව්‍ය කට්ටලයක්ද ලබාදෙන ලදී. මේ සඳහා පෙරමග සාමාජිකයින්ද පුද්ගලික මට්ටමින් දායකත්වය ලබාදෙන ලද්දේ පෙරමග සහෘදයන්ගේ එකමුතු බව මනාව පිළිඹිබු කරමිනි.

## වෙසක් සහ පොසොන් සැරසිලි කටයුතු

සම්බුදු තෙමඟුල සිහි කරමින් ධම්පල් විදුබිම වෙසක් පුන් පොහෝ දින අලංකාර පහන් කූඩුවලින් ආලෝකමත් කිරීම පෙරමග දශක කණ්ඩායම විසින් සිදු කළ අතර පොසොන් පොහොය දිනයේදීද මේ අයුරින්ම පහන් කූඩු මගින් ධම්පල් භූමිය අලෝකමත් කරවන ලදී.





## ආදි ශිෂ්‍ය සංගමයේ සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රයෝජනය සඳහා ප්‍රක්ෂේපණයන්ත්‍රයක්, තිරයක් සහ ශ්‍රව්‍ය පද්ධතියක්

අදහස් හුවමාරු/ප්‍රකාශ කිරීමට දැනට අප විසින් වාචික ක්‍රමයට අමතරව මුද්‍රිත මාධ්‍යය පරිහරණය කරයි. නමුත්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් මගින් අදහස් හුවමාරු/ප්‍රකාශ කිරීම වඩාත් ඵලදායී මෙන් ම විශ්වාසදායි වන බව අප සියලු දෙනාම දන්නා කරුණකි. මෙම හේතුන් මූලික කොටගෙන ආදි ශිෂ්‍ය සංගමයේ සම්මන්ත්‍රණ ශාලාවට ප්‍රක්ෂේපණ යන්ත්‍රයක්, තිරයක් සහ ශ්‍රව්‍ය පද්ධතියක් සවි කිරීමට යෝජනා ස්ථිර වී ඇත. මෙමගින් ආදි ශිෂ්‍ය සංගමයේ ඉදිරි වැඩ කටයුතු



වඩාත් පහසු කිරීමටත් කාර්යක්ෂම කිරීමටත් හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පෙරමග පොකුර ව්‍යාපෘතිය

2019 වර්ෂයේ මුල් භාගයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් දැනට සාමාජිකත්වය ලබාගෙන ඇති පෙරමග සාමාජිකයින්ගේ තොරතුරුයාවත්කාලීනකිරීමසිදුකෙරේ. මෙමගින් පෙරමග ව්‍යාපෘති සඳහා සම්පත් දායකයින් පෙරමග සාමාජිකත්වය අතරින්ම සොයාගැනීමට හැකි වන පරිදි දත්ත එකතුවක් සකස් කිරීම මූලික අරමුණ විය. එමෙන් ම සාමාජිකයින්ගේ වෙනස් වී ඇති පෞද්ගලික දත්ත (ලිපිනය, දුරකථන අංක ආදිය) යාවත්කාලීන කිරීමද මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය, උප ලේකම්වරු තිදෙනාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

## ව්‍යාවස්ථා සංශෝධනය

ගයාන් රුක්ෂාන් මහතා සහ සනත් ලසන්ත මහතා සම සභාපති වශයෙන්ද, නයෝමාල් ඉඹුලාන මහතා ලේකම් වශයෙන්ද, පසුගිය සභාපතිවරුන්ගේ සහභාගීත්වයෙන් ව්‍යාවස්ථා සංශෝධනයේ කටයුතු සිදුකෙරෙමින් පවතියි. පෙරමග සඟරාව මුද්‍රණය කරන අවධිය වනවිට ව්‍යාවස්ථා සංශෝධනයෙන් 50%කට වඩා සිදු කර අවසන් කර ඇති බව දැනුම් දෙමි.

## විෂබීජහරණ සහ සෞඛ්‍යාරක්ෂණ ක්‍රියාවලිය සඳහා දායකත්වය

2020 වර්ෂය අගභාගයේදී සහ 2021 වර්ෂය ආරම්භයේදීද පාසලේ විෂබීජහරණය සඳහා පෙරමග දශක කණ්ඩායම විසින් දායකත්වයන් සපයන ලදී. ඊට අමතරව 2021/2022 පරිපාලන වර්ෂයේදී අධෝරක්ත උෂ්ණත්වමාන 4ක් පාසල වෙත ලබාදෙන ලදී.




## වොලිබෝල් ක්‍රීඩා පිටිය අසල පැතිබැම් ඉදිකිරීම සඳහා දායකත්වය සැපයීම

පාසලේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා සිදුකරන දායකත්වයක් වශයෙන්, වොලිබෝල් ක්‍රීඩා භූමිය අසල පැතිබැම් ගොඩනැගීම සඳහා අවශ්‍ය කළු ගල් සහ යකඩ කම්බි ලබාදීම පෙරමග දශක කණ්ඩායම විසින් සිදු කරන ලදී.

## පාසලේ මාධ්‍ය ඒකකයේ වායුසමීකරණය අලුත්වැඩියා කිරීම

පාසල් මාධ්‍ය ඒකකය ස්ථාපිත කොට ඇති කාමරයට අයත් වායුසමීකරණ යන්ත්‍රය අක්‍රියව තිබූ බැවින්, පාසලේ ඉල්ලීම පරිදි වායුසමීකරණ අලුත්වැඩියා කිරීම සිදුකොට එම යන්ත්‍රයට අදාල දුරස්ථ පාලක යන්ත්‍රයක්ද අප සංගමය විසින් සපයනු ලැබී ය.

## පුස්තකාලයේ දත්ත යාවත්කාලීන කිරීම

මෙම පරිපාලන වර්ෂයේදීද සිදුකරන ලද පුස්තකාලයේ ඇති පොත් ලැයිස්තුගත කිරීම පසුගිය වසර අගභාගයේදී ආරම්භ කළ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම අවසානය දක්වාම පෙරමග සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය මේ සඳහා ලබාදෙන ලදී.

## අවුරුදු සුභපැතුම්පත්

පෙරමග දශක කණ්ඩායමේ අරටුව පෙරමග සාමාජිකයින් වේ. කෝවිඩ් වසංගත කාලයේ වුව ද සාමාජිකයින් හට සුහදව ආමන්ත්‍රණය කිරීමක් හැටියට මෙම කර්තව්‍යය පෙන්වා දිය හැක. ඒ අනුව පෙරමග සාමාජිකයින් සියලුම දෙනාට සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය සංකේතවත් කොට සුභපැතුම් පත් තැපැල් මගින් බෙදාහරින ලදී.

## පෙරමග පසුවිපරම

පෙරමග පසුවිපරම සංකල්පය යනු පසුගිය වර්ෂයන්හිදී සිදුකරන ලද ව්‍යාපෘති පිළිබඳව සොයාබලා වර්තමානයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමයි. පෙරමග දශක කණ්ඩායම විසින් පාසල තුළ සිදු කරන ලද සුවිශේෂ ව්‍යාපෘති ක්ෂය වී යාම වැලැක්වීම මෙහි ප්‍රධාන අරමුණයි. එසේ සිදුකරන ලද ව්‍යාපෘති ලෙස, 6-9 වැසිකිළි පද්ධතිය අසල කාණුවට පස් ඇතුලු අනෙකුත් අපද්‍රව්‍ය වැටීම වැලැක්වීම උදෙසා, කාණුවට උඩින් කොන්ක්‍රීට් ලෑලි අතුරා නිසි පරිදි සැකසීම සිදුකිරීම සහ වැසිකිළි පද්ධතිය අවට පිරිසිදු කිරීමේ කටයුතු, කෞතුකාගාරය පිරිසිදු කිරීම, හරිත ව්‍යාපෘතිය මගින් අදාල නඩත්තු කටයුතු සිදු කිරීම, රුවන් වැකි පුවරු පිරිසිදු කර අලුත්වැඩියා කිරීම වැනි ක්‍රියාකාරකම් පෙන්වාදිය හැකිය. මෙම ව්‍යාපෘති උප සභාපතිවරු තිදෙනාගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී.

## මව් සංගමයේ ලොතරැයි දිනුම් ඇදීම

මව් සංගමයේ ලොතරැයි දිනුම් ඇදීමේ ව්‍යාපෘතියට පෙරමග දශක කණ්ඩායම විසින් සුවිශේෂී දායකත්වයක් ලබාදෙමින් ටිකට් පොත් 95ක් විකුණනු ලැබී ය. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන උප සභාපති චමිදු විජයවර්ධන මහතා විසින් සොයා බලා කටයුතු කරන ලදී.

## සංසඳ දශක කණ්ඩායමේ ලොතරැයි දිනුම් ඇදීම

සංසඳ දශක කණ්ඩායමේ මූල්‍ය උත්පාදන ව්‍යාපෘතියක් වන ලොතරැයි දිනුම් ඇදීමේ ව්‍යාපෘතිය සඳහා දායකත්වයක් සැපයීම වශයෙන් අප වෙත ලොතරැයි ටිකට් පොත් කිහිපයක් භාරදෙන ලදී. විධායක සභාවේ සාමාජිකයින් විසින් මෙම ව්‍යාපෘතිය සඳහා හැකි පමණින් දායකත්වය දැක්වීය.

*- ධනංජ ඇල්විටිගල*
*ලේකම් (2021-2022)*
*පෙරමග දශක කණ්ඩායම*

Fabric Lanka
Exclusive Collection of Designer Materials




0713 395 395
102, Pamunuwa Road,
Maharagama.

# "යහ ගුණ මාතා" ලෙස අභිමන් ලැබූ දම්පල් අඹරේ පෑයූ ගුරු තරුව

**පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ සෞඛ්‍යදාන, බැඩ්මින්ටන් ක්‍රීඩාව නගාසිටවූ මාලනී ආටිගල අබයරත්න ගුරු මෑණියන් සමගින් සිදු කළ සාකච්ඡාව**



"මිශ්‍ර පාසල් අතරින් මුලු ලෝකෙවත් නැතිව ඇති මේ තරම් හොඳ, ශීලාචාර ඉස්කෝලයක්. මම ඒක බය නැතිව කියනවා. ඉස්කෝලෙදි සමහර විට ළමයි අපෙන් බැනුම් අහනවා තමයි. ඒත් තැනකට ගියාම රත්තරන් ළමයි." ධර්මපාල විද්‍යාලය පිළිබඳවත් දම්පල් දූ පුතුන් පිළිබඳවත් මෙතරම් ආදරයකින් වදන් පෙළගස්වන්නී අන් කවරෙකුත් නොව ධර්මපාලයට ඉමහත් සේවයක් ඉටුකළ මාලිනී ආටිගල අබයරත්න ගුරු මෑණියන් ය. දම්පල් මවින් සෙවනේ සිප් සතර හදාරා එහිම ගුරුතුමියක් ලෙස දහස් ගණනක් දූ දරුවන්ට යහමඟ පෙන්වූ ඇය අද විශ්‍රාම සුවයෙන් පසුවන්නීය. ධර්මපාලය පිළිබඳ සිය මතකය ආවර්ජනය කරන්නට අපි ඇයට ඇරයුම් කළෙමු. මේ දිගහැරෙන්නේ ඒ කතාබහයි.

**ඔබතුමිය ධර්මපාල විද්‍යාලයේ දීප්තිමත් ආදිශිෂ්‍යාවක්. පාසල් කාලය ගැන ඔබතුමියගේ මතකය අවදි කළොත්...**

මම හෝඩිය පන්තියට ඇතුළු වෙන්නෙ 1947 පෙබරවාරි හය වැනිදා. එතකොට හිටපු විදුහල්පතිතුමා තමයි ජී. සී. එදිරිසිංහ මහතා. දොඹ ගස්, අඹ ගස් දෙපසින් තිබුණු අඩිපාරෙ තමයි අපි ඉස්කෝලෙ ගියේ. ඒ දවස්වල මේ ගම හරි ලස්සනයි. ඒ කාලෙ එක පන්තියක ළමයි දහදෙනෙක් වගේ තමයි හිටියේ. පාසලේ විවිධ වසර වල දී පන්ති නායිකාවක් වශයෙන් කටයුතු කළා. මම හිටියේ මෞර්ය නිවාසයේ. ක්‍රීඩා තරග වලින් නම් දිනලා නැහැ. නමුත් ගීත ගායනා තරග වලින් ප්‍රථම ස්ථානය ලබාගෙන තියෙනවා. සාහිත්‍ය සංගමයේත් ක්‍රියාකාරීව කටයුතු කළා. ඒ කාලේ ලයනල් රංවල මහතාගේ "ඉනා බෙහෙත" නාට්‍යයේ රංගනයට මමත් දායක වුනා. 1964 වර්ෂයේදී උසස්පෙළට පෙනී සිටියා.

**පාසල් කාලයේ අත්දැකීම් ගැනත් අපි කතා කරමු.**

ගෙදරටම කොටු වෙලා හිටපු මට සමාජ ආශ්‍රය ලැබුණේ පාසලෙන්. ප්‍රාථමික අංශයේ ඇරැච්චිල පැත්තට කන්දක් වගේ තිබුණා. ඉතිං අපි ඉන්ටවල් එකේදී ඒ කන්ද දිගේ ඔහේ දුවනවා. සමහර වෙලාවට එතන තිබුණු වැටත් කඩනවා. ඉතිං ඒ කාලෙ හරි සුන්දරයි. දැන් වගේ පහසුකම් නැති වුනත් ඒ කාලෙත් අපේ පාසල හැම අතින්ම හොඳයි. ඒ දවස්වල අපිත් එක්ක පාසලේ හිටපු අය අතරින් කෙනෙක් තමයි ඔලිවර් රණසිංහ මහතා. තව ගොඩක් අය ඉන්නවා. මට නම් වශයෙන් හරියටම මතක නැහැ.

**ගුරු වෘත්තියට පිවිසීමෙන් පසුව ඔබ උගත් පාසලේම සේවය කිරීමට ඔබතුමියට අවස්ථාව ලැබෙනවා. ඒ අත්දැකීම ගැන අපට කියන්න.**

1964 වර්ෂයේදී උසස් පෙළට පෙනී සිටියත් ඉන් පස්සේ රැකියාවක් කරනවාට දෙමාපියන් කැමති වුනේ නැහැ. ඒ නිසා ටික කලක් ගෙදරට වෙලා හිටියා. 1983 වසරේ දී ගුරු විදුහලට තෝරාගැනීමේ විභාගයෙන් ඉහළ ලකුණු ලබාගෙන මහරගම ගුරු විදුහලට ඇතුළත් වෙන්න මට හැකි වුනා. එහි තුන් අවුරුදු පුහුණුවෙන් පසුව දුෂ්කර සේවයට රත්නපුර දිස්ත්‍රික්කයට යන්න වුනා. 1987 වසරේ තමයි මට ධර්මපාල විද්‍යාලයට සේවය කරන්න අවස්ථාව ලැබෙන්නේ. මම හරිම ආසාවෙන් මගේ පාසලේ සේවයට එක්වුනා. මිශ්‍ර පාසලක්නේ. පොඩි පන්ති වල දී ගැහැණු ළමයි පිරිමි ළමයි ගහගන්නවා. ඒත් නවය දහය පන්තිවලට යද්දි හරිම එකමුතුයි. 2002 දක්වාම මම ධර්මපාලයේ සේවය කළා. ඒ කාලය තුළ අධ්‍යාපන මෙන් ම විෂය බාහිර ක්‍රියාකාරකම් අතිනුත් සැලකියයුතු සේවයක් කරන්න මට හැකිවීම ගැන ලොකු සතුටක් තියෙනවා.

**පාසල් ඉතිහාසයේ බොහෝදෙනෙක් ඔබතුමිය හඳුනන්නේ සෞඛ්‍යදානය තුළින් ඉමහත් සේවයක් ඉටුකළ ගුරුතුමියක් විදියට. අපි ඒ මතකය අවදි කරමු.**

සෞඛ්‍යදාන ඒකකය බාර ගුරුතුමිය වශයෙන් මම බාරගත්තේ විශාල වගකීමක්. එහිදී මම සෞඛ්‍යදානයේ සාමාජික දරු දැරියන් සමග පාසල තුළත් ඉන් පිටතත් ප්‍රථමාධාර ලබාදීම, සෞඛ්‍ය කඳවුරු වලට සහභාගී වීම හා වෙනත් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු රැසක් සිදු කළා. සමහර ළමයි පීරියඩ් එකක් කට් කරන්න ඕන වුනාමත් බඩ අල්ලගෙන සෞඛ්‍යදානෙට එනවා. ඉතිං මම අහනවා ගණං බඩේ අමාරුවද, ඉංග්‍රීසි බඩේ අමාරුවද කියලා. සෞඛ්‍යදානයේ මම පුහුණු කරපු හොඳ නායකයෝ හිටියා. එයාලා හැකි හැම වෙලාවෙම සෞඛ්‍යදාන ඒකකයට ඇවිත් සේවය කළා. ඒකකයට අවශ්‍ය බෙහෙත් ගන්න අපි කැට වලට සල්ලි එකතු කරනවා. එහෙම කැට අරගෙන යනකොට සමහර අය අපහාස කරපු අවස්ථා, බැනපු අවස්ථා තිබුණා. ඒත් අපි අපේ සේවය කරගෙන ගියා.

දවසක් ඉස්කෝලෙ ඉස්සරහ ගේට්ටුව ළඟ කහ ඉර උඩ වාහනයක් කඩාගෙන බිඳගෙන ගිහිල්ලා, ළමයෙක් වැටිලා ඉන්නවා. ළමයාට සිහිය නෑ. හැමෝම කෑගහනවා. ඒ වෙලාවෙම පිටිපස්සෙන් ආපු වෑන් එකකට ළමයා දාගත්තා. මම කෑගහලා කිව්වා 'ප්‍රින්සිපල් සර්ට පණිවිඩේ කියන්න, මම ළමයා හොස්පිටල් ඇඩ්මිට් කරන්න යනවා' කියලා. ඉතිං ළමයා ඇඩ්මිට් කරලා එයාගෙ අම්මලා එනකන් මම ළඟ හිටියා. ළමයාගේ ගෙදරට පණිවුඩේ කිව්වට කවුරුත් මගේ ගෙදරට පණිවුඩේ කියලත් නෑ. ඉතිං ඒ වගේ මම කවදාවත් ළමයෙක්ට අසනීප වුණ වෙලාවට දාලා ගිහින් නෑ.

පාසල් සෞඛ්‍යදාන ඒකකයේ හතළිස්වන සංවත්සරය අපි ඉහළින්ම සැමරුවා. ඒක හැමෝම අගය කළා. ඒ වගේම ශ්‍රී ලංකාවේ පනස්වන නිදහස් සමරු උළෙලේදීත් අපේ සේවය ඉතා ඉහළින් අගය කරමින් ජනාධිපති අතිරේක ලේකම් නියන්ගොඩ මහතා මටත් සෞඛ්‍යදානයේ සිසු දරුදැරියන්ටත් පැසසුම් සහතික ප්‍රදානය කළා.

**බැඩ්මින්ටන් ක්‍රීඩාව භාර ගුරුතුමිය ලෙසත් ඔබතුමිය කාලයක් කටයුතු කළා නේද?**

ඔව්, ඉස්සර අපිට බැඩ්මින්ටන් කෝට් එකක් තිබුණේ නෑ. හෝල් එකයි ප්‍රින්සිපල්ගෙ ඔෆිස් එකයි අතරෙ ලණු ඇදලා බොරලු ගොඩේ



තමයි සෙල්ලම් කළේ. ඉතිං ළමයි වැටිලා තුවාල වෙනවා. ඒ ළමයින්ව සෞඛ්‍යදානෙට ගෙනිහින් බෙහෙත් කරනවා. පස්සෙ අමාරුවෙන් සල්ලි එකතු කරලා කෝට් එක හැදුවා. මම ළමයින්ගෙ වගකීම බාරගෙන පුහුණු කඳවුරුවලට ගෙනියනවා. අම්මලා හරියට අගයකළා ළමයින්ව වගකීමෙන් ආරක්ෂා කිරීම ගැන. ඉස්කෝලෙ වාහනේ නැතිවුනාම අපේ ගෙදර වාහනෙන් ළමයින්ව එකකරගෙන යනවා තරග වලට. හිටපු විදුහල්පති විමලසේන මහත්මා අපට ගොඩක් උදව් කළා. මට පුලුවන් වුනා බැඩ්මින්ටන් වලින් ඊ ඩිවිෂන් හිටපු අපේ පාසල සී ඩිවිෂන් දක්වා ගෙනයන්න. ලංකාවෙ ප්‍රධාන පාසල් එක්ක තරග කරලා අපි ජයග්‍රහණය කළා. සමස්ත ලංකා තරග දිනුවා. ඒක ළමයින්ට ලොකු අභිමානයක් වුනා.

ඊට අමතරව මම ශිෂ්‍ය නායක බණ්ඩයේ අනුශාසක වශයෙනුත් කටයුතු කළා. ඒ සඳහා නෝමන් රණසිංහ ගුරු මහත්මාගෙන් ලැබුණු සහයෝගය අගයකළ යුතුයි.

**ඔබතුමිය විශ්‍රාම දිවියක් ගතකළත් තවමත් පාසලේ කටයුතු වලට සම්බන්ධ වෙනවා. ඔබගෙන් අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හමුවූ විට ලැබෙන ප්‍රතිචාර කෙබඳු ද?**

මම ළමයින්ට ආදරෙයි වගේම ළමයිනුත් මට ආදරෙයි. සමහර ළමයින්ව දැන් මට මතකත් නැහැ. ඒත් මුණගැහුණාම ඒ ළමයි දුවගෙන ඇවිත් කකුල් දෙක ළඟ වැඳ වැටෙනවා. ඒක හදවතින්ම එන දෙයක්. ඉතිං හරිම ආසයි. මට ඒ ළමයි ගැන විශාල ආදරයක් වගේම ගෞරවයකුත් ඇතිවෙනවා. මම ගරු කරනවා ළමයින්ට. මගෙන් ඉගෙනගෙන ඉහළ තැන්වල ඉන්න ළමයින්ට මම සර් කියලා කතා කරලා බැනුම් අහලාත් තියෙනවා 'ඇයි ටීච එහෙම කතා කරන්නෙ, මම සර් නෙවෙයි. ටීචගෙන් ඉගෙනගත්තු ළමයෙක්' කියලා.

**වර්තමානයේ පාසල් අධ්‍යාපනය ලබන දරු දැරියන්ට ඔබතුමිය ලබාදෙන උපදේශය කුමක්ද?**

එකම දේ තමයි ගුරුවරයා උගන්වන වෙලාවට වෙනත් දේවල් හිතන්නේ නැතිව ගුරුවරයාට ඇහුම්කන් දෙන්න. බැරි දේ අහන්න. ගුරුතුමිය අම්මෙක් කියලා හිතන්න. එය තමයි අධ්‍යාපනය ලබන දූ දරුවන්ට දෙන්න තියෙන උපදේශය.

තමා උගත් පාසලේම ගුරුවරියක ලෙස කටයුතු කරමින් දැඩි කැපවීමකින් ඉටු කරන ලද සේවාව වෙනුවෙන් මාලිනී අබයරත්න ගුරු මෑණියන් "යහගුරුමාතා" සම්මානයෙන් ද පිදුම් ලැබීය. හෝරාවකට අධික කාලයක ආදරණීය කතාබහ නිමාකොට සමුගන්නා අවස්ථාවේ එතුමිය අපගෙන් කළ ඉල්ලීම වූයේ එතුමිය යටතේ සෞඛ්‍යදානය, ශිෂ්‍ය නායක බණ්ඩය හා බැඩ්මින්ටන් කණ්ඩායම්වල කටයුතු කළ දූ දරුවන්ට එතුමිය අමතන්නැයි දැනුම් දෙන ලෙසයි. පෙරමග අපි මේ ආදරණීය ගුරු මෑණියන්ට නිදුක් නිරෝගී සුව හා දීර්ඝායුෂ පතමු.

*-සංජය ද සිල්වා, උදාර කත්‍රිආරච්චි*




M155

ලංකාවටම
PHYSICS
LIVE ONLINE CLASS

THEORY
REVISION
PAPER CLASS
විෂය කොටස් සියල්ල ආවරණය කෙරේ

ලියාපදිංචි වීමට
gravityedu.lk
වෙත පිවිසෙන්න...

අනුරාධ සමරවීර
B.Sc.(Colombo)

HOT LINE : 077 661 3840

M156



තිරසී

THIRASI
BOOKSHOP & COMMUNICATION

• Photocopy • Printout (Laser & Ink) • Type Setting
• Binding • Laminating • Barcode Printing
• All kinds of stationaries

345/2C, Rukmale Road, Kottawa.
+94 112 899 955 | +94 777 803 452 | +94 713 880 882 / 83
thirasibooks@gmail.com

M153

BEST
WISHES

from Nadun
KRISHANTHA
2002 A/L

M063



Samanda
SC
Construction


# SAMANDA
## CONSTRUCTION (PVT) LTD.

---

**0112 173 557 | 0773 777 545**



M140
Best wishes from
සියසර
2011 - 2020
DHARMAPALA VIDYALAYA PANNIPITIYA


M136
Pragathi Lanka International
No. 3/2, Highlevel Road,
Godagama, Homagama
0777 137 394


M134
PEAK
PROPERTIES PVT LTD.
Experience the luxury comfort for affordable price.
Just pay the small monthly rental and live your life
with your family close to Colombo.
277, Depanama, Pannipitiya.
077 726 5946
peakpropertieslk@gmail.com


M145
BEST WISHES
FROM
Milinda Madhawa Perera
2007 A/L Maths


M132
SOIL INVESTIGATE (PVT) LTD
All your soil investigation reports and testing in one place
We are providing,
• Soil testing
• Groud drilling to stone
• Providing testing certificate with quality and validated
(Under Soil Tech Engineers in University of Moratuwa)
Hot line - 0768 690 366


M144
BEST
WISHES
From
Nadeesha Kularathna
13 C 1
2008 A/L Batch


# PLATINUM
HOMES & CONSTRUCTIONS (PVT) LTD.



Architectural House Designing
Related Local Authority Approvals
Construction work under supervision of Engineers
High Quality Long Lasting Materials

95/8D, Mihindu Mawatha,
Makumbura, Pannipitiya.
0768 201 115 | 0768 201 116
platinumhomes.32@gmail.com

M139




# අභිනව ධම්පල් කායවර්ධන මධ්‍යස්ථානය නොබෝ දිනකින්ම සිසු අයිතියට

දශක 8කට වැඩි කාලයක් පුරා පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයෙන් බිහිවූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය මෙතකැයි කියා කියන්නට බැහැ. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම මිශ්‍ර පාසලක් ලෙස, අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා ලබාදෙන සහයෝගය, ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජය කෙහෙළි නංවන සිසු සිසුවියන්ට ලබාදීමට සැමවිටම අපේ පාසැල උත්සුක වෙනවා. ඒ නිසාමයි පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය, බස්නාහිර පළාතේ හොඳම මිශ්‍ර පාසැල ලෙස නැවත නැවතත් අභිමානයට පාත්‍රවන්නේ.



කෙසේ නමුත්, පසුගිය වසර කිහිපය තුළ දී, ක්‍රිකට්, පාපන්දු, රග්බි සහ මළල ක්‍රීඩාවල නිරතවන සිසු සිසුවියන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් වඩාත් දියුණු තත්වයට පත් කිරීමේ දී අභියෝග රැසකට මුහුණපාන්නට පාසලට සිදු වුණා. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ශාරීරික යෝග්‍යතාවය ඔප් නැංවීමට අවශ්‍ය පහසුකම් සහ උපකරණ, පාසැල තුළ නොමැතිවීම ඉන් ප්‍රධාන අභියෝගයක්. එසේ නොමැතිකම නිසාම දෙමාපියන්ට විශාල මුදලක් වැය කරමින්, උසස් තත්වයේ කාය වර්ධන මධ්‍යස්ථානයකින් දරුවන්ට අවශ්‍ය ඒ පහසුකම් ලබාදීමට සිදු වුණා. තවද, නිසි මග පෙන්වීමකින් තොරව මෙම කායවර්ධන සහ ශාරීරික යෝග්‍යතා ක්‍රියාකාරකම් සිදුවුවහොත්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට දීර්ඝකාලීන අබාධාවල ලක්වීමේ අවධානමක් ඇතිවී තිබුණා. අධ්‍යාපන අමාත්‍යංශය විසින් පාසල් දරුවන්ගේ කායික සහ මානසික හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින්, ක්‍රීඩා විෂය අනිවාර්යය කර ඇති අවධියක, ධම්පල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැතිවීම පාසලට විශාල අඩුපාඩුවක් වුණා.

මෙම කාලීන අවශ්‍යතාවය හඳුනාගත් විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය, හිටපු විදුහල්පති

K.G. විමලසේන මැතිතුමාගේ මග පෙන්වීම යටතේ, අප විද්‍යාලයේ අභිනව කායවර්ධන මධ්‍යස්ථානයේ පළමු අදියරේ වැඩ කටයුතු ආරම්භ කරමින්, එහි මුල්ගල තැබීම 2020 දෙසැම්බර් 11 වනදා සිදුකරනු ලැබුවා. මුල්ගල තැබීමේ අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූයේ ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ සහ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, නාමල් රාජපක්ෂ මැතිතුමායි. පර්චස් 11ක භූමි ප්‍රමාණයක ඉදිවන මෙම නවීන පහසුකම්වලින් සපිරි අංගසම්පූර්ණ කායවර්ධන මධ්‍යස්ථානය සඳහා වැයකරන මුළු මුදල රුපියල් මිලියන 16ක්. මුල්ගල තැබීමේ උත්සවයට හිටපු විදුහල්පති K.G. විමලසේන, ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපති ජීවන් ප්‍රියදර්ශන යාපා, ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් දුමින්ද සංජීව බාලසූරිය යන මහත්වරුන් ඇතුළුව සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී වුණා.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු කිහිපයක් ඇත. ඒවානම්:

01. පාසල් සිසුන්ගේ, ගුරුවරුන්ගේ, ආදි ශිෂ්‍යයන්ගේ මෙන් ම පාසැල අවට පුද්ගලයින්ගේ කායික සහ මානසික සුවතාවයන් ඉහළ නැංවීම
02. නවීන අංගෝපාංග සහ නිසි මගපෙන්වීම යටතේ පාසලේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ශාරීරික යෝග්‍යතාවය වඩාත් ඉහළ මට්ටමකට ගෙන ඒම
03. අන්තර්ජාතික මට්ටමේ කායවර්ධන පුහුණුවක් සහ නවීන කායවර්ධන පහසුකම් ලබාදීම
04. අවට පාසල්වල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කායවර්ධන පුහුණුවට අදාල පහසුකම් ලබාදීම
05. පාසලේ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා රුකුලක් වන ආදායම් මාර්ගයක් ලෙස ස්ථාපිත කිරීම

මේ වනවිට ධම්පල් කායවර්ධන මධ්‍යස්ථානයේ අවසන අදියරේ වැඩ කටයුතු ආරම්භ වී ඇති අතර, තව නොබෝ දිනකින් සියලු වැඩකටයුතු නිම කිරීමට බලාපොරොත්තු වේ. කඩඩෂෘ වසංගතය හමුවේ වුව ද, නිසි සෞඛ්‍ය රෙගුලාසි වලට අනුගත වෙමින්, මෙතෙක් පාසැලට අඩුපාඩුවක්ව පැවති මෙම ව්‍යාපෘතිය, අපේ රම්‍ය විදුහලට ලබාදීමට අවශ්‍ය සියළුම කටයුතු කඩිනමින් සිදුකිරීම ආදි ශිෂ්‍ය සංගමයේ අභිලාශය වේ. ඒ තුළින් පාසලේ ක්‍රීඩා කටයුතුවල නිරත වන සිසුන්ට අවශ්‍ය සියළුම කායවර්ධන ක්‍රියාදාමයන් අප පාසැල තුලින්ම ලබාදී ඔවුන්ගේ මෙන් ම, පාසලේ සමස්ථ ක්‍රීඩාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට රුකුලක් ලබාදීමයි.

*- හියල් බියගමගේ*






M010

With best compliments from

HEMAS HOSPITALS

"By Your Side"

HEMAS HOSPITALS
www.hemashospitals.com

Hemas Hospital - Wattala
389,Negombo Road, Wattala.
Tel 0117- 888 888 Fax: 0117-888 765
E-mail: info@hemashospitals.com
Web: www.hemashospitals.com

Hemas Hospital - Thalawathugoda
647, Pannipitiya Road, Thalawathugoda, Sri Lanka
Tel 0117- 888 888 Fax: 0112-445 613
E-mail: capital@hemashospitals.com
Web: www.hemashospitals.com

ACHSI



SHUTTERSTOCK©

# COVID-19 සමයේ නූතන අධ්‍යාපනයේ දිශානතිය

අධ්‍යාපනය යනු අප ජීවිතයේ වඩාත්ම බලවත් අවියයි. සෑම දෙයකම පිටුපස ඇති අරුත සොයා ගැනීමට අධ්‍යාපනය හරහා අපට ඉඩ සැළසෙන අතර, ලොව සෑම දෙනෙකුගේම ජීවිත විශාල පරිවතනයකට ලක් කිරීමට අධ්‍යාපනයට සුවිශේෂී හැකියාවක් ඇත.

එසේම අධ්‍යාපනය අපට අවට ලෝකය පිළිබඳව අවබෝධයක් ලබාදෙන අතර, එම දැනුම ඥාණාන්විතව භාවිතා කිරීමෙන් අපේ ජීවිතය නිවැරැදි දිශාවට යොමු කරගැනීමට අපට හැකියාව ලැබෙයි.

කෙනෙකුගේ ජාතිය, ආගම හා ස්ත්‍රී පුරුෂ භාවය කුමක් වුවත්, ඔහුට හෝ ඇයට ලොව විවිධ තරාතිරම්වල සිටින අනෙක් සියලුම පුද්ගලයන් හා එක සමානව එකට සිටගැනීමට ඉඩ හසර ලබාදෙන්නේ අධ්‍යාපනය මගිනි. ඒ අනුව සමස්ථයක් ලෙස ගතහොත් අධ්‍යාපනය යනු සියලු බාධක පරාජය කිරීමට හැකි වේදිකාවකි.

මෙයට බොහෝ කලකට පෙර අධ්‍යාපනය යනු සමාජයේ එක්තරා කොටසකට පමණක් සීමාවූ ''වරප්‍රසාදයක්'' ලෙසින් සැළකුණත් වර්තමානය වන විට එය දුප්පත් පොහොසත් භේදයකින් තොරව සැමටම භුක්ති විඳිය හැකි ''අයිතිවාසිකමක්'' බවට පත්ව ඇත.

### ඇති නැති පරතරය මැනවින් කියාපාන අධ්‍යාපනය

නොමිලේ අධ්‍යාපනය ලැබීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මූලික අයිතිවාසකමක් ලෙසින් සඳහන් කර නැතත්, ''නූගත්කම මුළුමනින්ම තුරන් කිරීම සහ සියලු මට්ටම්වල අධ්‍යාපනය සඳහා විශ්වීය සහ සමාන ප්‍රවේශයක් සඳහා ඇති අයිතිය පිළිබඳව සියලුම පුද්ගලයන්ට සහතික වීම'' යනුවෙන් වගන්තියක් ඊට ඇතුළත් කොට ඇත. ශ්‍රී ලංකාවේ අපට ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා නොමිලේ ලබාගැනීමට අපට හැකියාවක් ලැබී ඇත්තේ ඒ අනුවය.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ රජයේ පාසල් 10,012 ක් ඇති අතර ඒවායේ ඉගෙනුම ලබන සිසු සිසුවියන් සංඛ්‍යාව මිලියන 4.2 කට අධිකය. මෙම දුවා දරුවන්ගේ නුවණැස පාදන ගුරුවර ගුරුවරියන්ගේ සංඛ්‍යාව 235,924 කි.

වර්තමානයේදී අප රටේ දකින්නට ලැබෙන අධ්‍යාපන පද්ධතියේ ඉතිහාසය යටත්විජිත අවධිය දක්වා දිව ගියද, ගෝලීය අධ්‍යාපන ක්‍රමය සමග සැසඳීමේදී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ක්‍රමය තවමත් නිසි පරිදි යාවත්කාලීන වී ඇති බවක් පෙනෙන්නට නැත. ගෝලීය මට්ටම හා සැසඳීමේදී අපේ රටේ පාසල් නවීන තාක්ෂණය ප්‍රමාණවත් පරිදි උපයෝගී කර නොගන්නා නිසා ශ්‍රී ලංකාව සහ සෙසු ලෝකය අතර තාක්ෂණික හිඩැසක් නිර්මාණය වී ඇත.

එහෙත් කොවිඩ්-19 ව්‍යාප්තියත් සමගම පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා වූ සමස්ථ අධ්‍යාපන පද්ධතියටම මේ වන විට නවීන තාක්ෂණ ක්‍රමවේදයන් අත්හදා බැලීමේ ඇති වැදගත්කම අවබෝධ වී තිබීම සැළකිය යුතු වර්ධනයක් බව පැවසිය යුතු ය. මෙහිදී අප මුහුණ පා සිටින අභියෝග බොහෝය. වසංගත තත්ත්වය හේතුවෙන් පාසල් සහ විශ්වවිද්‍යාල වසා දමා ඇති තත්ත්වයක් තුළ පෙර පාසල් සිසුන්ගේ සිට විශ්ව විද්‍යාල සිසුන් දක්වා වූ සමස්ථ ශිෂ්‍ය ප්‍රජාවටම මාර්ගගත ක්‍රමය ඔස්සේ අධ්‍යාපනය ලැබීමට සිදුව ඇතත්, ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික තත්ත්වය හේතුවෙන් ඔවුන් සියලු දෙනාටම එම අවස්ථාව එකසේ ලැබෙනවාද? යන ගැටළුවට මේ වන විට අප මුහුණ පා සිටියි.

### මාර්ගගත අධ්‍යාපනයේ අභියෝග

මාර්ගගත අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය කරන උපකරණ බහුල නොවීම, අන්තර්ජාල පහසුකම් සපයන ආයතනවල ආවරණ කලාපය සීමාසහිත වීම මෙන් ම මාර්ගගත අධ්‍යාපනය සම්බන්ධයෙන් බොහෝ දෙනෙකු තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම ද මේ වන විට අප මුහුණ පා සිටින ගැටළු අතර වෙයි.

මාර්ගගත අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය කරන මෙවලම් හිඟ සහ සේවා ආවරණ කලාපයෙන් බැහැරව සිටින ග්‍රාමීය පාසල්වල ඉගෙන ගන්නා දරුවන් වෙනුවෙන් රූපවාහිනය වැනි ශ්‍රව්‍ය දෘෂ්‍ය ක්‍රමවේදයන් ඔස්සේ අධ්‍යාපනය ලබාදීම වඩා පිළිගත හැකි විකල්පයක් ලෙසින් පෙනී ගියත්, එහි ඵලදායීතාවයද සීමාසහිතය.

අධ්‍යාපනය සඳහාම වෙන්වූ රූපවාහිනී නාළිකා නොමැති වීම, දැනට තිබෙන රූපවාහිනී නාළිකාවල වෙනත් වැඩසටහන් අතරතුර අධ්‍යාපන වැඩසටහන් සඳහා ගුවන් කාලය වෙන් කර ගැනීමේ ගැටළුව, රූපවාහිනිය ඔස්සේ විෂය කරුණු උගන්වන ගුරුවරුන්ගේ උදාසීන ඉගැන්වීමේ ශෛලිය මෙන් ම සම්මත පංති කාමරයකදී මෙන් ගුරුවරයා සහ ළමයින් අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් නොමැති වීම ද රූපවාහිනිය හරහා ඉගැන්වීමේදී මුහුණ පෑමට සිදුවන ගැටළුය.

ඒ හැරුණු කොට මාර්ගගත සහ රූපවාහිනිය හරහා අධ්‍යාපනය ලබාදීමේදී මුහුණ දීමට සිදුවන ප්‍රබලම ගැටළුව වන්නේ දරුවන්ගේ සමාජ කුසලතා සහ පෞරුෂය වර්ධනය නොවීමයි.

පාසල් යන වයසේ දරුවෙක් පාසලෙන් අධ්‍යාපනයට අමතරව තවත් බොහෝ දෑ තම ජීවිතයට උකහා ගන්නා අතර, කණ්ඩායමක් ලෙසින් වැඩ කිරීම, ශාරීරික ක්‍රියාකාරකම්, පෞරුෂ වර්ධනය, සමාජ කුසලතා සහ සමාජය සමග ගැටීමේ මූලික පාඩම් දරුවා අත්පත් කරගන්නේ පාසලෙන් සහ පංති කාමරයෙනි.

එබැවින් කොවිඩ්-19 වසංගත තත්ත්වය පහව යනතුරු අධ්‍යාපනය ලබාදීම සඳහා දැනට ඉතිරිව ඇති හොඳම විකල්පය වන මාර්ගගත අධ්‍යාපනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් සංවර්ධනය කරන අතරම, රට තුළ දරුවන්ට රෝග බියකින් තොරව යළි පාසලට පැමිණ අධ්‍යාපනය ලැබිය හැකි සුරක්ෂිත වටපිටාවක් නිර්මාණය කිරීමට රජය කටයුතු කළ යුතු ය.


අනෙක් අතට කොවිඩ්-19 වැනි ගෝලීය වසංගත තත්ත්වයක් නිසි පරිදි පාලනය කිරීමට රජයට පමණක් හැකියාවක් නොමැති නිසා, මවුපියන් සහ වැඩිහිටියන් ලෙසිට අපි අපේ සහයෝගය රජයට ලබාදිය යුතු ය. අපේ දරුවන්ට යළි පාසල් ගොස් විෂය කරුණුවලට අමතරව සමාජ කුසලතාද ජීවිතයට එකතු කරගෙන, සාර්ථක මිනිසෙකු ලෙසින් සමාජය සමග මුහු වීමට හැකියාවක් ලැබෙන්නේ එවිටය.


*- වත්සලා රාජගුරු*



M050
SCHOOL OF
MUSIC
Eastern and Western Music
Online Classes (Zoom Meeting)
0772286477/0763524590
Grade 6 to A/L
School Syllabus
(Both theory and Practical classes)
▪ කුඩා කණ්ඩායම් පන්ති (එක් පන්තියක් සඳහා සිසුන් 12ක් පමණ බඳවා ගැනේ)
▪ 1 ශ්‍රේණිය සිට වයස් සීමාවක් නොමැතිව සංගීතය හැදෑරීමට කැමති සිසුන් සඳහා පන්ති.
▪ පාසල් විෂය නිර්දේශිත සංගීත සිද්ධාන්ත හා ප්‍රායෝගික පන්ති.
▪ සංගීත විශාරද විභාග (භාත්ඛණ්ඩ සංගීත විද්‍යාපීඨය මගින් පවත්වන)
▪ ජාතික සංගීත විභාග සඳහා.
▪ ABRSM විභාග
▪ සා/පෙළ හා උ/පෙළ සංගීතය හදාරන සිසුන් සඳහා විශේෂ පුනරීක්ෂණ පන්ති (ප්‍රායෝගික හා ලිඛිත )
Visharad Aruni Liyanage
No.06, Galawila Road, Homagama
0763524590 / 0772286477
Our Youtube Channel
Swara Music Channel
(Music Lessons)
Subscribe Us!


M110
Best Wishes From
CHATHUMI
CONSTRUCTIONS
526/2, Pitipana South,
Homagama.
0718 280 589


M111
HASIRA
CONSTRUCTIONS
Building & Road Contractors
66/2, Watareka, Padukka. 0712 212 417


M025
YORK HARDWARE (PTE) LTD.
Importers, Dealers in General Hardware & Tools
Authorized Dealer for
DeWALT Black & Decker STANLEY Power Tools
YORK HARDWARE
Best Wishes
141-G 6, Messenger Street, Colombo 12.
Tel: 0112 478767/4949528/2444269 | Mobile: 0777 745273
Fax: 0112 346767/0114 610910 | E-mail: yorkhardwarepl@gmail.com


M031
බී.ඇම්. විජයසිංහ පොත්හල
උණුසුම් සුබපැතුම්!
B.M. Wijayasinghe Book Shop
No. 220, Main Street, Ratnapura.
Tel: 045 2222385, 045 2222658
Fax: 045 2223776


M028
NEVER LET OBSTACLES TO STOP YOU
ROADIAN MT
ARPICO
Richard Pieris
Tyre Company Ltd.
HOTLINE 0777 119 339


M019
Depanama
Water Villa
RECEPTION HALL
WEDDINGS
GET TOGETHERS
ANY OTHER FUNCTIONS
No. 196/26, Isuru Uyana, Depanama, Pannipitiya. | Tel: 0112 839 446 | Moibel: 0772 032 786 | Web: www.depanamawatervilla.com

# පෙරමග අතීතයෙන් බිඳක්...

*- චමිදු විජයවර්ධන*



පෙරමග දශක කණ්ඩායමේ ප්‍රථම විධායක කමිටුව - 2007








පෙරමග දශක කණ්ඩායම විසින් 2008 සහ 2017 වසරවල දී පැවැත්වූ සුහද හමුවීම්







දුෂ්කර පාසල් කිහිපයකට පෙරමග දශක කණ්ඩායම විසින් 2014, 2016 සහ 2017 වසරවල දී පරිත්‍යාගයන් සිදුකරන ලදී



පෙරමග දශක කණ්ඩායම විසින් නව කෞතුකාගාරය හා ප්‍රවේශ ශාලාව ස්ථාපිත කර පාසල වෙත භාරදීම



COVID-19 සමයේ තෝරාගත් පවුල් වලට උපකාර කිරීමට දියත් කළ දම්පල් සවිය ව්‍යාපෘතියට දයකත්වය ලබා දීම



පාසලේ ගෘහස්ත Badminton ක්‍රීඩාගාරය ඉදිකිරීම වෙනුවෙන් දායකත්වය ලබාදීම



වසර කිහිපයක් පුරා සාර්ථකව සිදු කෙරෙන භාවිතයෙන් ඉවත්කළ මේස සහ පුටු ප්‍රතිසංස්කරණය කර නැවත භාවිතයට ගත හැකි ලෙස සැකසීමේ ව්‍යාපෘතිය




Palians Walk
සංකල්පය සඳහා පෙරමග දායකත්වය



පාසලේ පිහිනුම් තටාක සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් පෙරමග දායකත්වය




පුස්තකාලය අසල සහ ප්‍රධාන ශාලාව අසල දැල්වැට ප්‍රතිසංස්කරණය කිරීම. පුස්තකාලය අසල මංතීරුවට කොන්ක්‍රීට් ගල් ඇතිරීම.




විද්‍යාලය තුළ නිතර ඇස ගැටෙන ස්ථාන වල රුවන් වැකි සහිත නාමපුවරු ප්‍රදර්ශනය කිරීම



කළුබෝවිල ශික්ෂණ රෝහලේ හදිසි ප්‍රතිකාර අංශයට එක්ස්-රේ වාර්ථා බහාලුම් පරිත්‍යාග කිරීම




රටට, ජාතියට, රණවිරුවන්ට සහ පාසලට සෙත්පතා සංවිධානය කළ දම්පල් පාලිය 2009 සහ 2010 වසරවල දී පැවැත්විණි



පෙරමග අනුග්‍රහය දැක්වූ Mini Netball තරගාවලිය



2019 වාර්ෂික ක්‍රිකට් තරගාවලියේ හොඳම පිතිකරුවා සහ පන්දු යවන්නා හට ක්‍රීඩා උපකරණ ලබාදීම




උසස් පෙළ විද්‍යාගාර සඳහා රසායනික ද්‍රව්‍ය ඇතුලු විද්‍යාගාර උපකරණ ප්‍රදානය කිරීම



පෙරමග විසින් 2015 වසරේ ඉදිකරන ලද ගණිතාගාරය 2019 නවීකරණය කරන ලදී






















Marians, Wayo, Daddy සංගීත කණ්ඩායම් සමගින් ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ ගායක ගායිකාවන් සහභාගී වූ දැවන්ත ගෘහස්ත සංගීත ප්‍රසංගයන් 8ක් 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අඛන්ඩව සංවිධානය කරන ලදී



සියලු පහසුකම් වලින් සමන්විත වැසිකිළි පද්ධතියක් 6-9 ශ්‍රේණි සඳහා ඉදිකර දෙන ලදී





13 වසරක් පුරා පැවැත්වෙන පෙරමග සය සාමාජික ක්‍රිකට් තරගාවලියේ අවස්ථා කිහිපයක්



උෂ්ණත්වමාන සහ විෂබීජහරණ උපකරණ පාසැල වෙනුවෙන් පරිත්‍යාග කරන ලදී



2019 වසරේ දී පෙරමග සඟරාව ආරම්භ කිරීම



සාමාජික ප්‍රවර්ධනය සඳහා Membeship Hut ව්‍යාපෘතිය



# ජනප්‍රියත්වය පමණක් බලාපොරොත්තුවෙන් නිවේදකයෙකු වෙන්න එපා

**වාසනා ලක්මාලි මෑත කාලයේ ලංකාවේ බිහිවූ ජනප්‍රිය සහ විශිෂ්ට සමප්‍රවේශිකාවක් (Compere). වඩාත් වැදගත්ම කාරණය නම් ඇය අපේ පාසලේ කීර්තිමත් ආදි ශිෂ්‍යාවක්. ඇගේ කාර්යබහුල ජීවිතයෙන් මද විරාමයක් ලබාගෙන පෙරමග අපිත් සමග සුහද පිළිසඳරකට සම්බන්ධ වුණා. මේ, ඇය දැක්වූ අදහස් කිහිපයක්.**

**ඔබගේ පාසල් කාලය ගැන සිහිපත් කලොත්...**

මම මුලින් පාසල් අධ්‍යාපනය ලැබුවේ පනාගොඩ පරාක්‍රම විද්‍යාලයේ. අනතුරුව මිශ්‍ර පාසලක අධ්‍යාපනය ලැබීමේ සිහිනය සැබෑ කරගනිමින් මම පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයට පැමිණියා. පුංචි කාලෙ ඉඳලා මම සෑම බාහිර ක්‍රියාකාරකමකම නිරත වුනේ ලොකු උනන්දුවකින්. විවාද, කථික, ගායනා, නර්ථන, ක්‍රීඩා ආදී වූ සියලුම ක්‍රියාකාරකම් වලට මගේ දැඩි උනන්දුවක් තිබ්බා. ඒ හැමදේකදීම මට ශක්තියක් වුනේ මගෙ තාත්තා.

බාහිර ක්‍රියාකාරකම් කරන අතරම අධ්‍යාපන කටයුතු වලටත් මගෙ පූර්ණ අවධානය යොමුවෙලා තිබ්බා. ඒ නිසාම මම ගුරුවරුන්ගේ ප්‍රශංසා වලට නිරතුරුව ලක් වුණා වගේම පංති නායිකාව, විෂය නායිකාව වගේ තනතුරු මට නිතරම ලැබුනා. ඒ වගේම මම සාමාන්‍ය පෙළ දක්වාම සංගීත විෂය වගේම නර්තන විශයත් හැදෑරුවා. අනතුරුව නාට්‍ය සඳහා මගෙ හිත යොමු වුණා. මම ගොඩක්ම කැමති වුණේ නාට්‍ය ලියන්න. 2005 දී ධර්මපාල විද්‍යාලය මඟින් පැවැත් වූ සංකලන තරඟාවලියේ මම රචනා කළ "ගල් අඟුරු" නාට්‍ය හොඳම නිෂ්පාදනයට හිමි සම්මානය ලබාගන්නවා.

උසස් පෙළ ප්‍රතිඵල වලින් මට විශ්ව විද්‍යාල ප්‍රවේශයට ලකුණු මදි වුනා. නමුත් මට නීතිය හදාරන්න ලොකු හීනයක් තිබ්බා. ඒ අතරතුර නිලාර් එන්. කාසිම් මහතා School of Arts Management කියලා ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරනවා. 2007 දී එම පාඨමාලාවට මම සම්බන්ධ වුණා. ඒකෙන් වැඩිම ලකුණු ලැබුනෙ මට. එතනින් පස්සෙ මට මාධ්‍ය ක්ෂේත්‍රය ගැන ලොකු ආසාවක් සහ උනන්දුවක් ඇති වුණා.

**ඔබ නිවේදනය සඳහා යොමු වුනේ කොහොමද ?**

ඇත්තටම මම පිරිසක් ඉස්සරහ කතා කරන්නෙ දහම් පාසලේ ඉගෙනගනිද්දී. ඒ අවස්ථා මට ලැබුනේ පන්සලේ හාමුදුරුවො අපේ ටීචර් ට කිව්වා "මේ ළමයාට හොඳට වචන උච්ඡාරණය කරන්න, ගාථා කට පාඩමින් කියන්න පුලුවන් ඒ නිසා කතාවක් දීලා බලන්න." කියලා. එතනින් පටන් ගත්ත ගමන තමයි මේ දක්වා මම ඇවිත් තියෙන්නෙ.

School of Arts Management සමග සම්බන්ධ වෙන්න කලින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට නිවේදකයින් සඳහා සම්මුඛ පරීක්ෂණයක් තිබුණා. මමත් ඊට සහභාගී වුණා. රට වටෙන්ම ඇවිත් හිටිය ලොකු පිරිසක් අතරින් මාව අන්තිම 12දෙනා අතරට තේරුනා. අනතුරුව School of Arts Management ඩිප්ලෝමාවේ වැඩිම ලකුණු ලබාගත් ශිෂ්‍යයා නිසා නිලාර් සර් මාර්ගයෙන් මට නැවතත් අවස්ථාවක් ලැබෙනවා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමග සම්බන්ධ වෙන්න. එදා නිලාර් සර් මාව හඳුන්වා දෙන්නේ නිෂ්පාදක රවී අබේවික්‍රම මහතාට. මට අවස්ථාව ලැබෙනවා "ආදරණීය යෞවනය" කියන වැඩසටහන කරන්න. කොහොමවුනත් පෞද්ගලික කරුණු කිහිපයක් නිසා මම මගේ

ජීවිතයේ පළමු වතාවට මාධ්‍ය ක්ෂේත්‍රයෙන් ඈත් වෙනවා.

නමුත් නිවේදිකාවක් වෙන්න මට තිබ්බ හීනය නිසා විදෙස් ගතව සිට 2013 දී ලංකාවට පැමිණි ප්‍රවීණ මාධ්‍යවේදී ලාල් හේමන්ත මාවලගේ මහතා ආරම්භ කල නිවේදන වැඩමුලුව සඳහා මම සහභාගී වෙනවා. එම වැඩමුළුවට සහභාගී වීමෙන් අනතුරුව මාවලගේ මහතා විසින්ම මෙහෙය වූ NITT හි මාධ්‍ය ඩිප්ලෝමාවට සහභාගි වෙනවා. එතනින් හොඳම ප්‍රතිඵල ලබාගන්න මට පුලුවන් වුනා. ඔය අතරතුර ස්වාධීන රූපවාහිනී සේවය සඳහා බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණයකට කැඳවනවා. ඒත් එක්කම Colombo Television නාලිකාවේ නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් ලෙස සම්බන්ධ වීමටත් මට හැකිවුණා.

ඔය අතරතුර තමයි කැපිටල් මහරාජා සමූහය නැවතත් TV 1 පටන් ගත්තෙ. එහි සම්මුඛ පරීක්ෂණයෙන් මම ඉහළින්ම සමත් වෙනවා. ඒ අවස්ථාවෙම තමයි මට ස්වාධීන රූපවාහිනී සේවයෙනුත් කතා කරන්නෙ එන්න කියලා. නමුත් මම TV 1 සමගම රැඳෙන්න තීරණය කරනවා. 2015 ඔක්තෝබර් 20 තමයි මම TV 1 සමඟ සම්බන්ධ වෙන්නෙ. එතැන් සිට වසර 4ක්ම මම හොඳම සිංහල සම්ප්‍රවේශක විදිහට රයිගම් සම්මාන උළෙලේ නිර්දේශ වෙනවා.

2018 අන්තිම මම සිරස TV ආයතනයට එනවා. එතනදී මම නිවේදන, නිෂ්පාදන යන අංශවලින් විශාල වැඩ කොටසක් ඉටු කරනවා. දකුණු ආසියාවේ විශාලම මැදිරි සංකීර්ණය වූ Stein Studios හි වැඩ කරන්න ලැබීම ද ලොකු භාග්‍යක්. 2020 වසරේ හොඳම සිංහල සම්ප්‍රවේශක විදිහට රයිගම් සම්මාන උළෙලේ සම්මානය ලබා ගන්නවා.

මම මේ වෙද්දී ජනාධිපති මාධ්‍ය අංශයේ සේවය කරනවා. වර්තමාන ආරක්ෂක ලේකම් ජෙනරල් කමල් ගුණරත්න මැතිතුමා අපේ පාසැලේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙක්. එතුමාව බොහොම ගෞරවයෙන් මතක් කරනවා මේ වෙලාවේ. එතුමා නිසයි මට ජනාධිපති මාධ්‍ය අංශයට සම්බන්ධ වෙන්න අවස්ථාව හිමිවන්නේ.

**පාසල් කාලයේ ඔබේ මතකයේ රැඳුන චරිත කවුද ?**

මම ඇත්තටම ගොඩාක් ගරු කරන චරිතයක් තමයි K.G. විමලසේන විදුහල්පතිතුමා. එතුමා ඉදිරියේ මට මාගේ හැකියාවන් පෙන්නන්න ගොඩාක් අවස්ථා ලැබුණා. ඒ නිසාම එතුමා මගේ හැකියාවන් පිළිබඳව දැනගෙන සිටියා. මම පාසලෙන් අයින් වන මොහොතේ පවා එතුමා ඉල්ලා සිටියා අපි වගේ තව පිරිසක් පාසලෙන් බිහි කිරීමට උදව්වෙන්න කියලා.

ඒ වගේම මට ආර්ථික විද්‍යාව උගන්වපු ශාන්ති ගුරු මෑණියන්ව වගේම, හිටපු නියෝජ්‍ය විදුහල්පති ප්‍රනාන්දු මහතාවත් අමතක කරන්න බෑ.

**මෙම ක්ෂේත්‍රයට පැමිණෙන ආධුනිකයන්ට ඔබ ලබාදෙන උපදෙස කුමක්ද ?**

ඇත්තටම උපදෙසක් දෙන්න තරම් තැනක මම තවම නෑ කියලා මම හිතන්නෙ. නමුත් මම කියන්න කැමතියි මම මුල් අවස්ථාවෙ කළා වගේ තමන්ගෙ හීන අත අරින්න එපා. කොහොම හරි තමන්ගෙ හීනයට එන්න මාර්ගය හදාගන්න.

අහිත් දේ ජනප්‍රියත්වය පමණක් බලාපොරොත්තුවෙන් නිවේදකයෙකු වෙන්න එපා. ඊට වඩා ලොකු වගකීමක් අපිට තියනවා. අපි කියන වචන හරිම වැදගත්. මේ ක්ෂේත්‍රය ගැන හොඳ අවබෝධයකින් එන්න.

**අවසාන වශයෙන් ඔබගේ බලාපොරොත්තු ගැන ඇහුවොත්....**

මට සැලසුම් එකක් කියලා නම් නෑ. මම සෑම දෙයක්ම කරන්නෙ සැලසුම් දෙක තුනක් එක්ක. ඉදිරියේදී බොහෝ විට මාධ්‍ය ක්ෂේත්‍රය හැර වෙනත් ක්ෂේත්‍රයකින් මාව දකින්න පුලුවන් වේවි.



M078

**SINGER**®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer - Boralesgamuwa

24, Colombo Road, Boralesgamuwa.
0773 739 696 / 0112 150 596
boralesgamuwa@singersl.com

M079

**SINGER**®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer - Rathmalana

387/C, Galle Road, Rathmalana.
0112 735 048
ratmalana@singersl.com

M072

**JSB**

TRADING



## JSB Trading (Pvt) Ltd.

Importers & Suppliers of
Heavy Machinery Spare Parts

1566/2E/2, Sirimalwatte, Kottawa, Pannipitiya.
jsbtradingltd@gmail.com

**0773 567 896 / 0712 337 333**

M080

**SINGER**®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer - Bandaragama

51, Horana Road, Bandaragama.
0382 289 922
bandaragama@singersl.com

M081

**SINGER**®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer Wadduwa

557/B, Galle Road, Wadduwa.
0382 284 510
wadduwa@singersl.com

M076

BEST
WISHES FROM

## MAYURA STORES

SALIYA BANDARA

No: 190/3A,
Hokandara South,
Hokandara

TEL : 071 - 4899767
011 - 3619239

M082

**SINGER**®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer Panadura - B

39, Horana Road, Panadura.
0382 234 528
panadura_b@singersl.com

M083

SINGER®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer Panadura - A

350, Galle Road, Panadura.
0382 237 398
panadura@singersl.com

M087

SINGER®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer - Piliyandala - B

76, Moratuwa Road, Piliyandala.
0112 613 350 / 0753 613 350
piliyandala_b@singersl.com

M084

SINGER®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer Moratuwa - B

08, Old Galle Road, Moratuwa.
0112 647 697 / 0759 709 700
moratuwa_b@singersl.com

M088

SINGER®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer Piliyandala - A

48, Colombo Road, Piliyandala.
0112 617 560 / 0719 622 397
piliyandala@singersl.com

M085

SINGER®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer Budget Shop Moratuwa

17, New Galle Road, Moratuwa.
0112 645 154
discountstoremoratuwa@singersl.com

M086

SINGER®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

## Singer - Piliyandala - C

117, Horana Road, Piliyandala.
0115 742 954
piliyandala_c@singersl.com

M089

SINGER®

ශ්‍රී ලංකාවේ අංක 1 වෙළඳනාමය

# SINGER KOTTAWA

121/4, Highlevel Road, Kottawa.
0112 843 314
kottawa@singersl.com

M049

Best Wishes from,

# Manoj & Tharindu

2007 A/L Batch

Best Wishes from,

Serah & Emily




SUBSCRIBE

to our YouTube Channel,

Scan Me

https://youtube.com/channel/UCcdF0vzkEtALkKN_L4Mv36w

මෙල්බර්න් වල විස්තර දැනගන්න, අපිත් එක්ක එකතු වෙන්න ...

M148

No.1
CABLE
IN SRI LANKA

ACL
CABLES

M013

Best Wishes from

Party Deco Sri Lanka

Party Deco Sri Lanka !!

For all types of party decorations
to your doorstep as quick as possible...

071 974 0004 /
076 539 6675

Party Deco
Sri Lanka

Partydeco70

M158

Best Wishes from !!

LLOYDS AUTO MART (PVT) LTD

Our Products and Services

Contractors - Engineering General
Medical Equipment and supplies
Motor spare parts and repairs
Telecommunication equipment and systems
Contractors - Building and General




No. 43/1, Sri Saranankara Road, Kalubowila, Dehiwala.
TP: +94 2672411
Mobile: +94 777 487877 (Mr. Razmi)
Fax: + 94 2672418
Email: lloyds12@sltnet.lk

M167

eLearning.lk

ඔබට නවීන ලෝකයේ
රැකියාවකට අවශ්‍ය දැනුම ලබා ගැනීමට
නොමිලේ පාඨමාලා රාශියක්

අදම ලියාපදිංචි වන්න

M171

BEST WISHES FROM
D D Dilan,
Yashoda
Disula, Hasali

M168

britol AROMA

visit us
www.britolstore.lk




Detergent Powder
Super Matic
Washing Powder
Fabric Conditioner
and Laundry Liquid

M032

# BEST WISHES

*from*

**Shamila Kalubowila**

**&**

**Manel Kalubowila**

M057

PRIME TASTE BAKERS

*Great taste in every bite*

**Head Office :** 522/A, Halapitiya, Welmilla Junction, Bandaragama, Sri Lanka.

**Main Outlet :** 13, Super Market Complex, Kalutara Road, Bandaragama, Sri Lanka.

**E mail :** primetastebakers@gmail.com

**Tel : 0715 92 76 73 | 0385 68 62 69**

M060

**BEST WISHES**

From

K. D. Lakmal
Anuruwan Kalubowila

M. G. Anusha Lakmali

